ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය

SRI LANKA NATIONAL FREEDOM FROM HUNGER CAMPAIGN BOARD

இலங்கை தேசிய பட்டினி ஒழிப்பு இயக்கச் சபை



# 2017

# වාර්ෂික වාර්තාව
# ANNUAL REPORT
# வருடாந்த அறிக்கை



# පටුන

| මාතෘකාව | පිටු අංකය |
|---|---|
| දැක්ම සහ මෙහෙවර | 2 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 3 |
| සභාපතිතුමාගේසමාලෝචනය | 6 |
| මණ්ඩලයේ තොරතුරු | 7 |
| සමස්ත කාර්ය සාධනය -2017 | 8 |
| වාර්ෂික ගිණුම් වාර්තාව | 13 |
| විගණකාධිපති වාර්තාව | 39 |

## දැක්ම

***ගොවි ජනතාවගේ සහ අඩු වරප්‍රසාද ඇති ජනතාවගේ අභිමානය නැවතත් ඇති කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් ආර්ථික ස්වාධීනත්වය සහ ස්ව විශ්වාසය ඇති කිරීම.***

## මෙහෙවර

***ප්‍රතිලාභීන්ගේ ආර්ථික ස්වාධීනත්වය ඇති කිරීමටත් අනුන් මත යැපීමේ සංස්කෘතිය මගහැරවීම සඳහාත් කෘෂිකර්ම, පශු සම්පත් සහ වෙනත් ක්ෂේත්‍ර වල නිපුණතා සංවර්ධනය සඳහා සහභාගීත්ව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම***

# 2017 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩලය

**(2017.01.01 සිට 2017.06.30 දක්වා)**

| නම | තනතුර | සේවාස්ථානය |
|---|---|---|
| ධම්මික පීරිස් මහතා | සභාපති | ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය ( ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය) |
| රවී ක්‍රිෂාන් ජයවර්ධන මහතා | උපසභාපති | ශ්‍රීලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය ( ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය) |
| කේ. මහේසන් මහතා | අතිරේක ලේකම් (සංවර්ධන) | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතුඅමාත්‍යාංශය |
| එච්. පී. ජේ. ධර්මසේන මහතා | අධ්‍යක්ෂ ජනරාල් | මිනිස් බලය හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව |
| පී.එස්.එස්.විජේරත්න මහතා | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | කෘෂිකර්ම අමාත්‍යාංශය |
| ඩබ්. ඒ. ඩී. ඩී. එම්. ප්‍රියන්ත මහතා | ප්‍රධාන අභ්‍යන්තර විගණක | වැවිලි කර්මාන්ත  අමාත්‍යාංශය |
| විජයසිරි වික්‍රමසිංහ මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | අංක409/3සී,මහයියාවවත්ත,කලපුවාව,මුල්ලේරියාව නගරය |
| පී.ඩබ්.ධර්මසිරි වැලිකල මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | අංක95,බණ්ඩාරනායක මාවත,මිහිඳුපුර,අනුරාධපුර |
| ඒ.ටී.එම්. ඒකනායක මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | අංක 121,යසසිරිපුර, අනුරාධපුර |

# 2017 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩලය

**(2017.06.30 සිට 2017.12.31 දක්වා)**

| නම | තනතුර | සේවාස්ථානය |
|---|---|---|
| ධම්මික පීරිස් මහතා | සභාපති | ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය ( ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය) |
| කේ. ඒ. බණ්ඩාර මහතා | උපසභාපති | ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය ( ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය) |
| කේ. මහේසන් මහතා | අතිරේක ලේකම් (සංවර්ධන) | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතුඅමාත්‍යාංශය |
| එච්. පී. ජේ. ධර්මසේන මහතා | අධ්‍යක්ෂ ජනරාල් | මිනිස් බලය හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව |
| පි.එස්.එස් විජේරත්න මහතා | ජ්‍යොෂ්ඨ සහකාර ලේකම් | කෘෂිකර්ම අමාත්‍යාංශය |
| ඩබ්. ඒ. ඩී. ඩී. එම්. ප්‍රියන්ත මහතා | ප්‍රධාන අභ්‍යන්තර විගණන | වැවිලි කර්මාන්ත  අමාත්‍යාංශය |
| විජයසිරි වික්‍රමසිංහ මහතා | අධ්‍යක්ෂමණ්ඩල සාමාජික | අංක 409/3සී,මහයියාවවත්ත, කලපුවාව, මුල්ලේරියාව නගරය |
| පී.ඩබ්ලිව්.ධර්මසිරි වැලිකල මහතා | අධ්‍යක්ෂමණ්ඩල සාමාජික | අංක95,බණ්ඩාරනායක මාවත,මිහිදුපුර,අනුරාධපුර |
| ඒ.ටී.එම්. ඒකනායක මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | අංක 121,යසසිරිපුර, අනුරාධපුර |
| එච්. ආර්. ක්‍රිෂාන් නිලංග මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 898/ ඒ4, දියතෙර,පහලවෙල පාර, පැල්වත්ත |

## 2017වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩලරැස්වීම් පැවැත්වූ දිනයන්

374වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2017.01.31

375 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2017.02.23

376 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2017.03.31

377 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2017.04.26

378 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2017.06.06

379 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2017.06.30

380 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2017.07.31

381 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2017.08.28

382 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2017.09.29

383 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2017.10.31

384 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2017.11.17

2017 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල පැවැත්වූ වාර ගණන 11 කි.

**<u>සභාපතිතුමාගේ සමාලෝචනය.</u>**

දේශීය ආහාර රටාවක් ගොඩනැගීමේ ප්‍රමුඛ ආයතනයක් ලෙස 2017 වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරනු ලබනුයේ හද පිරි සතුටිනි.

අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ වස විසෙන් තොර දේශීය කෘෂි ආර්ථිකයක් මඟින් කෘෂිකර්මාන්තයේ තිරසාරසංවර්ධනයක් යන සංකල්පය පෙරදැරි කොටගෙන වස විසෙන් තොර සෞඛ්‍යමත් දේශීය ආහාර ප්‍රවර්ධනය උදෙසා කටයුතු කරමින් සිටිනු ලබන අතර මේ සඳහා ගරු කෘෂිකර්ම අමාත්‍ය දුමින්ද දිසානායක මැතිතුමාගේමඟපෙන්වීම හා ආශිර්වාදය අප හට මහඟු අත්වැලකි.

2017 වසර සඳහා අප මණ්ඩලය මඟින් පහත සඳහන් ප්‍රධාන ව්‍යාපෘති සිදු කරන ලදී.

1. පැළ තවාන් ව්‍යාපෘතිය
2. වස විස නැති අපේ ආහාර - හෙල්දි ෆුඩ් වෙළඳ සැල් ජාලය
3. පාරම්පරික වී මිලදී ගැනීමේ ව්‍යාපෘතිය
4. සහල් සබලකරණ ව්‍යාපෘතිය
5. ඌණ පලතුරු භාවිතා කරමින් පලතුරු බීම නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය
6. පෝෂණීය ධාන්‍යමය ආහාර (මව්පෝෂ, සුවපෝෂ සහ සහල් පිටි තෝස) නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය.
7. බුත්තල සහ තණමල්විල ගොවිපල සංවර්ධන ව්‍යාපෘතිය
8. ගොවි නිෂ්පාදන අලෙවි සැල් ව්‍යාපෘතිය
9. අගය එකතු කල සෝයා ආශ්‍රිත ආහාර නිෂ්පාදන ව්‍යාපෘතිය
10. සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කිරිමේ ව්‍යාපෘතිය
11. බඩඉරිඟු ආනයනය කිරීම
12. දේශීය සෝයා බෝංචි මිලදී ගැනීමේ ව්‍යාපෘතිය

අද්‍යතන අවශ්‍යතා වලට ගැලපෙන පරිදි නිෂ්පාදකයා සහ පාරිභෝගිකයා වෙත උපරිම සාධාරණයක් ලබාදීම සඳහාත් දේශීය ආහාර ජනතාවට භුක්ති විදීම සඳහාත් දෙහිවල සහ නාරාහේන්පිට ගොවි නිෂ්පාදන අලෙවි සැල් පිහිටුවා ඇති අතර එමඟින් නාගරික ප්‍රජාවදේශීය ආහාර සඳහා නැඹුරු කිරීම සිදුවේ. එසේම දෙහිවල සහ නාරාහේන්පිට නාගරික ප්‍රදේශවල පවත්වාගෙන යන පැළ තවාන් මඟින් නාගරික ජනතාව සඳහා අඩු ඉඩකින් උපරිම ඵලදාවක් ලැබෙන පරිදි කෘෂි බෝග වගා කිරිමේ ක්‍රම හා එළවළු, ඖෂධ පැළ සහ පලතුරු පැළ වර්ග සහන මිලට ලබා දීමටත්, වගාවන් සිදු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දීම ද සිදු කරයි.

එසේම අපගේ කලංකුට්ටිය සහ ගන්නෝරුව පිහිටි නිෂ්පාදනාගාර මඟින්, වස විස නැති පාරම්පරිකදේශිය සහල්, තෝසේ පිටි, විශේෂිත සහල් පිටි, මව්පෝෂ, සුවපෝෂ, වැනි නිෂ්පාදන රැසක් සිදු කරන අතර මෙම නිෂ්පාදන වෙළඳපලට ඉදිරිපත් කිරීමටද හැකියාව ලැබී ඇත.

එසේම විවිධ පර්යේෂණ ආයතන මඟින් නව පෝෂදායක ආහාර වර්ග එළිදක්වනු ලබන නමුත් ඒවා ප්‍රවර්ධනය සඳහා රජයේ ආයතන දක්වන දායකත්වය ඉතා අල්පය. ඒ අනුව එම කාර්යය සිදුකිරීමේ මූලික පියවර තබමින් ජනතාව අතරට වසවිස නැති දේශිය ආහාර මිලදී ගැනීමට හැකිවන පරිදි හෙල්දිෆුඩ් වෙළඳසැල් ජාලයක් ලංකාව පුරා ආරම්භ කර ඇති අතර ඒවා තව දුරවත් වැඩි දියුණු කිරීමට බලාපොරොත්තු වේ.

එමඟින් පාරම්පරික වස විසෙන් තොර දේශිය ආහාර වර්ග ජනතාව අතර ප්‍රචලිත කිරීමත් එමඟින් සුළු නිෂ්පාදකයින් වෙත උපරිම ආදායමක් ලබා දීමත් සිදු කරනු ලබන අතර ජනතාවගේ පෝෂණ තත්වය ඉහල නැංවීම සඳහා දායකත්වයක් ද ලබා දී ඇත.

අනුරාධපුර හා මොණරාගල දිස්ත්‍රික වල බඩ ඉරිඟු නිෂ්පාදනය කරන ගොවින් හට ඔවුන්ගේ නිෂ්පාදන සඳහා ඉහල මිලක් ලබා දී දිරිමත් කිරීම සඳහා එම අස්වනු සාධාරණ මිලකට මිලදී ගැනීම සිදු කරයි.

එසේම බඩඉරිඟු ආනයනය මඟින්දේශීය කුකුළු කර්මාන්තය සඳහා අවශ්‍ය බඩඉරිඟු මිල නියාමනය කළ අතර, ගොවීන්ගෙන් සෝයා බෝංචි ඉහළ මිලකට මිලදී ගෙන ඔවුන්ගේ ආර්ථික මට්ටම ඉහළ තබන ලදී.

මෙම කාර්යයන් තව දුරටත් පුළුල් කර ඉදිරියේදී වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරිමත්, නව නිෂ්පාදන හඳුන්වා දීමත්, ඒවා ජනතාව අතර සුලභ කිරීමත්, එමඟින් නිෂ්පාදකයාට සහ පාරිභෝගිකයාට සෙත සැලසීමත් යනාදී කරුණු මුල් කොටගෙන කටයුතු කිරිමට බලාපොරොත්තු වේ.

ධම්මික පිරිස්
සභාපති,
ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය.

**(ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය)**

## මණ්ඩලයේ තොරතුරු

**මණ්ඩලයේ නම:**

ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය
(ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේව්‍යාපාර මණ්ඩලය)

**පිහිටි ස්ථානය සහ නීතිමය ස්වරූපය:**

1973 අංක 15 දරන ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ පනත මගින් ස්ථාපිත කර ඇත..

**මූලික ක්‍රියාකාරකම් සහ අරමුණු:**

ප්‍රධාන ලෙස ආර්ථික අසාධාරණත්වයට භාජනය වූ ජනතාවට සේවය සපයන ආයතනයකි. අරමුණු වන්නේ;

- ආණ්ඩුව විසින් සකස් කරන ලද සංවර්ධන වැඩ පිළිවෙලට අනුකූලව සාමාජීය හා ආර්ථික සංවර්ධනය සඳහා ආණ්ඩුවේ නොවූ විදේශීය හා දේශීය නියෝජ්‍යාත්ව වල ආධාර ලබා ගැනීම
- මහජනෝපකාර, සාමාජීය හා ආර්ථික සංවර්ධනය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී ආයතනවලට හා වෙනත් මණ්ඩලවලට සහාය වීම
- කෘෂිකාර්මික හා කාර්මික සංවර්ධනය යොමු වූ නිශ්චිත යෝජනා ක්‍රමවලට ආධාර කිරීම එම යෝජනා ක්‍රම දියුණු කිරීම සහ සම්බන්ධීකරණය කිරීම
- කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදනය වැඩි කිරීම සඳහා වූ යෝජනා ක්‍රියාත්මක කිරීමෙහිලා ආණ්ඩුවේ නොවූ නියෝජ්‍යාත්ව උනන්දු කිරීම
- ජාත්‍යන්තර සාගිනි නිවීමේ ව්‍යාපාරය සහ වෙනත් ඒ හා සමාන පිටරට ආයතන, සංගම් හෝ සමිති සමග සහයෝගී වීම

**රේඛීය අමාත්‍යාංශය:**

කෘෂිකර්ම අමාත්‍යාංශය

**කාර්යාලය:**

අංක 45, කිරිමණ්ඩල මාවත, කොළඹ 5.
දුරකථනය : 0112506895/0113085378
ෆැක්ස් : 0112506907
විද්‍යුත් ලිපිනය: ffhc.srilanka@gmail.com

**විගණකවරු:**

- විගණකාධිපති දෙපාර්තමේන්තුව
- අභ්‍යන්තර විගණන අංශය
  කෘෂිකර්ම අමාත්‍යාංශය

**බැංකුකරුවන්:**

ලංකා බැංකුව - බොරැල්ල
මහජන බැංකුව - දෙහිවල

**උපාය මාර්ග:**

- සංවර්ධන මූලයන් සාමූහික අරමුණක් කෙරෙහි යොමු කිරීමට සමෝධානය කිරීම
- ගැමි ජනතාවට ආර්ථික සහ සමාජ වර්ධනයට, සහයෝගී වීම සඳහා අවස්ථාව ලබා දීම
- සංවර්ධන ක්‍රියාවලියට සහභාගීවීම සඳහා ගැමි ජනතාවට බලය ලබා දීම
- ස්වයං ප්‍රචලිත තිරසාර සංවර්ධනයක් ඇති කිරීම සඳහා පාරම්පරික ගැමි ජනතාවගේ ස්ව විශ්වාසය ඇති කිරීම සමඟ ලබා ගත හැකි අගයන් වෙත වෙනස් කිරීම
- දේශීය ආහාර භාවිතය සහ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම
- පසු අස්වනු හානිය අවම කිරීමේ තාක්ෂණයබිම් මට්ටම තෙක් රැගෙන යාම

# සමස්ත කාර්යසාධනය - 2017

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ සංවර්ධන අංශය මගින් 2017 වසරේදී ව්‍යාපෘති 12ක් ක්‍රියාත්මකකර ඇති අතර මෙම ව්‍යාපෘති වල සංක්ෂිප්තවාර්තාවක් පහතින් දැක්වේ.

මෙම ව්‍යාපෘති සිදු කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ වස විසෙන් තොර දේශීය ආහාර, අගය එකතු කළ ආහාර සහ පැල වර්ග ඇතුළු කෘෂි යෙදවුම් සහන මිලට පාරිභෝගිකයාට ලබා දී එමඟින් ඍජුව හා වක්‍රව දේශීය ගොවියාගේ ආර්ථික තත්වය නැංවීම හා සුළු හා මධ්‍යම පරිමාණ නිෂ්පාදකයින් සඳහා ඔවුන්ගේ නිෂ්පාදන දිරිමත් කිරීමෙන් ඔවුන් සවිබල ගැන්වීමයි.

## 1.පැල අලෙවිසැල - නාරාහේන්පිට

නාගරික වැසියන් අතර ගෙවතු වගාව ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය යෙදවුම් පහසු මිලට මිලදී ගැනීමට අවස්ථාව සැලසීම සඳහා මෙම පැල තවාන නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයේ ආරම්භ කරන ලදී. සියලු වර්ග වල මල් පැළ,ඌන භාවිතපලතුරු පැළ, එළවළු පැළ හා බීජ වර්ග මෙම පැළ අලෙවිසැල මඟින්සහන මිලට මිලදී ගත හැක.

මීට අමතරව එළවළු හා මල් පොහොර, කාබනික පොහොර, කෘමි විකර්ෂක, කෘෂි උපකරණ ආදිය මෙම ස්ථානයෙන් මිලට ගත හැකි අතර එසේම මෙම ස්ථානයෙන් බෝග වගා පිළිබඳ උපදෙස් ද නොමිලේ ලබා ගත හැක. මෙම වසරේ මෙම ව්‍යාපෘතිය සඳහා මෙහෙයුම් වියදම රු. මි 9.491 වන අතර මෙහෙයුම් ආදායම ලෙස රු. මි. 10.707ලබාගෙන ඇත. එසේම වසරේ ශුද්ධ ලාභය රු. මි.1.536කි.ඒ අනුව මෙම දත්ත අනුව පසුගිය වසරට වඩා මෙම ව්‍යාපෘතිය ප්‍රගතියක් ලබා ගෙන ඇත.




**පැලතවාන** **පැල අලෙවිසැල**

## 2.පැලඅලෙවි සැල - දෙහිවල

මෙම වසරේ මෙහෙයුම් ආදායම ලෙස රු.මි 5.828උපයා ඇති අතර රු.මි 4.894 කමෙහෙයුම්වියදමක් දරා ඇත.රු.මි 0.612 ක මුදලක් ශුද්ධ ලාභය ලෙස ලබාගෙන ඇත.

දෙහිවල අලෙවිසැල මඟින් ද නාරාහේන්පිට අලෙවි සැල ඉටු කරන කාර්යයන් සපුරාලයි.

## 3.ගොවි නිෂ්පාදන අලෙවිසැල - දෙහිවල

ජනතාව අතර වස විස නැති ආහාර ප්‍රචලිත කිරීමේ අරමුණින් යුතුව මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. මෙම අලෙවි සැල තුලින් දේශීය නිෂ්පාදකයින් සකස් කල අගය එකතු කළ ආහාර නිෂ්පාදන, පාරම්පරික සහල් වර්ග හා මණ්ඩලය විසින් නිෂ්පාදනය කරන මව්පෝෂ, සුවපෝෂ, තෝසේ පිටි සහ විශේෂ සහල් පිටි නිෂ්පාදන මිලට ගැනීමට අවස්ථාව ලබා දී ඇත. මීට අමතරව දේශීය සහ පාරම්පරික ආකාරයට සැකසූ උදෑසන හා දිවා ආහාර පාරිභෝගිකයන් හට සහන මිලට ලබා ගැනීමට අවස්ථාව ලබා දෙයි. දෙහිවල සත්වෝද්‍යානය තුලද මෙවැනි අලෙවි සැලක් පිහිටුවා ඇත.මෙම අලෙවි සැල් මඟින් පාරිභෝගිකයින්ට සහනායී මිලකට ගුණාත්මක ආහාර සැපයීම සිදු කරයි. මෙම වසරේ මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් වියදම රු. මි 36.968කි. මෙහෙයුම් ආදායම රු. මි. 35.142 කි.

## 4.බුත්තල සහ තණමල්විල ගොවිපල සංවර්ධනය

මෙම ගොවිපල ව්‍යාපෘතිය 1986 වසරේ සිට ආරම්භ කර පවත්වා ගෙන යනු ලැබේ.2017 වර්ෂය තුළ නියමු ව්‍යාපෘතියක් ලෙස කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කළ අතර එම වර්ෂයේදී මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් ආදායම රු. මි.1.612ක් වන අතර මෙහෙයුම් වියදම රු. මි1.792ක් වේ.ඉදිරියේ දි කොම්පෝස්ට් පොහොර වලට අමතරව කොහුබත් හාබදුන් මිශ්‍රණ ද නිෂ්පාදනය කර අප ආයතනයේ අලෙවිසැල් හරහා ජනතාව වෙත සහන මිලට ලබා දිමට බලාපොරොත්තු වේ.

තවද ප්‍රදේශයේ සාගිනි පවුල් වලද සහභාගිත්වයෙන් තණමල්විල ගොවිපල ආදර්ශ ගොවිපලක් ලෙස පවත්වා ගෙන යනු අතර කාබනික පොහොර නිෂ්පාදනයද ආරම්භ කිරීමට යෝජිතය. 2017 වසරේ තණමල්විල ගොවිපලේ මෙහෙයුම් වියදම රු. මි 0.483 කි. මෙහෙයුම් ආදායම රු. මි. 0.155 කි.

## 5.හෙල්දි භූඩ් භෝජනාගාරය – නාරාහේන්පිට

මෙම ව්‍යාපෘතිය 2014.04.01 දිනසිට නාගරික පාරිභෝගිකයන් වෙත සහන මිලට දේශීය ආහාර සැපයීම අරමුණු කොට ගෙන ආරම්භ කරන ලදී. මෙහිදි දේශිය වට්ටෝරු වලට අනුව ආහාර පිළියෙළ කර පාරිභෝගිකයන්ට ලබා දෙයි. මීට අමතරව ආයතනය විසින් නිෂ්පාදනය කරන ලද සහ සුළු හා මධ්‍යම ව්‍යවසායකයන් නිපදවන ලද දේශිය නිෂ්පාදන ද අලෙවි කරනු ලැබේ.2017වර්ෂයේදී මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් ආදායම රු.මි 2.447 ක් වූ අතර මෙහෙයුම් වියදම රු.මි 3.297 ක් වේ.එසේම මෙම ව්‍යාපෘතියට අදාළ 2017වර්ෂයේ ශුද්ධ අලාභය රු.මි 0.894 ක් වේ.වසර කිහිපයක් දිගින් දිගටම මෙම ව්‍යාපෘතියෙන් අලාභ ලබන බැවින් නැවත ප්‍රතිසංවිධානය කිරීමට නියමිතය.

## 6.සුවපෝෂ පෝෂණීය ආහාරය, සහල් පිටි, තෝසේ පිටි, මව්පෝෂ ව්‍යාපෘතිය

වතුකරයේ සහල් පිටි භාවිතය සහ ආහාර සැකසුම් ප්‍රචලිත කිරීමේ අරමුණින් සහල් පිටි සහ තෝසේ පිටි ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර මෙම ව්‍යාපෘතිය ගන්නොරුව සහ කලංකුට්ටිය කර්මාන්ත ශාලා වල ක්‍රියාත්මක වේ.සහල් පිටි, තෝසේ පිටි ව්‍යාපෘතිය අඩු බර ගර්භනී කාන්තාවන්ට පෝෂණ මල්ලක් සැපයීම යන ව්‍යාපෘති මහින්ද චින්තන සංකල්පයට අනුව ආරම්භ කරන ලදි.

## 7.සහල් සබලකරණ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියසදහා රු.මි 3.659 ක මුදලක් ලෝක ආහාර සංවිධානයෙන් ලැබුණු අතර මෙම ව්‍යාපෘතිය ලාභ ඉපයීමේ අරමුණින් නොව සමාජ සත්කාරයක් ලෙස ක්‍රියාත්මක කරයි.

ශ්‍රී ලංකාවේ දරුවන්ගේ ක්ෂුද්‍ර පෝෂක ඌනතාවය මහහැරවීමෙහිලා මූලික පියවරක් ලෙස යකඩ සහ ෆෝලික් අම්ලයේ සබලකරණ කරන ලද සහල් දිවයින පුරා ප්‍රවර්ධනය කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයේ පෝෂණ අංශයේ මෙහෙයවීම යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදේශනය මත අධ්‍යාපන අමාත්‍යාංශයේ සහභාගිත්වයෙන් ලෝක ආහාර වැඩ සටහනෙහි අනුග්‍රහයෙන් ක්‍රියාත්මක කරන ලදී.

මෙම ව්‍යාපෘතිය පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අධීක්ෂණය යටතේ නියමු ව්‍යාපෘතියක් ලෙස මහනුවර සහ මොණරාගල දිස්ත්‍රික්කවල දිවා ආහාර ලබාදෙන පාසැල් සඳහා ක්‍රියාත්මක කරන ලදි. එහි ප්‍රතිඵල මත ඉදිරියේදී දිවයින පුරා මෙම ව්‍යාපෘතිය ලෝක ආහාර වැඩසටහනේ අනුග්‍රහයෙන් ක්‍රියාත්මක කිරීමට නියමිතය.




**සහල් සබලකරණ ව්‍යාපෘතියට අදාලව ගිවිසුම අත්සන් කර භාර දීම**

## 8.ඌනභාවිත පළතුරු භාවිතා කරමින් RTS (Ready to serve drink) පළතුරු පානය නිෂ්පාදනය කිරීම

ඌනභාවිත පළතුරු පරිභෝජනය ජනතාව අතර ප්‍රචලිත කිරීම හා අගය එකතු කළ නිෂ්පාදනයන් හඳුන්වාදීමේ අරමුණින් යුතුව මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි. මෙහිදි වෙරළු, අනෝදා සහ අඹ මූලිකව පළතුරු ලෙස යොදා ගන්නා අතර ගන්නොරුව ආහාර පර්යේෂණ ඒකකයේ මෙම බීම නිෂ්පාදනය කෙරේ.මේ සඳහා රු.මි 0.14ක් ජෛව විවිධත්ව ආහාර හා පෝෂණ සංවිධානය මගින් ලැබුණු අතර මෙහෙයුම් ආදායම ලෙස 0.106 ක් උපයා ඇත.



RTS සැකසීම




බෝතල් කරන ලද RTS

## 9.පාරම්පරිකවීම්ලදීගැනීමේව්‍යාපෘතිය

නිරෝගී දිවිය හා සැමට ආහාර යන තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම සඳහා පාරම්පරික සහල් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි.ශ්‍රී ලංකාව පුරා පැතිරි යන බෝ නොවන රෝගවලින් වැලකීම සඳහා මෙම සහල් පරිභෝජනය වැදගත් වේ. මෙම සහල් පරිභෝජනය මඟින් නිරෝගි ජනතාවක් බිහිවීමත් දේශීය ගොවීන් සවිබල ගැන්වීමත් සිදු වේ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාරම්පරික වී වගා කරන ගොවීන්ගෙන්වී සාධාරණ මිලට මිලදී ගෙන කලංකුට්ටිය කර්මාන්ත ශාලාවේදී ඒවා සහල් බවට පත්කර දෙහිවල, නාරාහේන්පිට අලෙවිසැල් හා හෙල්දිඵුඩ් ෂොප් හරහා අලෙවිකිරීමසිදුකරයි.මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් වියදම රු. මි 1-956කි. ආදායම රු. මි1.936වේ.

## 10.වරලත්අලෙවිසැල්පිහිටුවීම( හෙල්දිඵුඩ්ෂොප්)

වස විසෙන් තොර ගුණාත්මක බවින් ඉහළ අගය එකතු කල දේශීය ආහාර පහසුවෙන් පාරිභෝගිකයන්ට ලබාගතහැකි අවස්ථා ඇතිකිරීම මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කල අතර දේශිය සහල්,ධාන්‍ය වර්ග හා සුළු හා මධ්‍යය පරිමාණ නිෂ්පාදකයින්ගේ විවිධ නිෂ්පාදන දෙසියකට ආසන්න ප්‍රමාණයක් මෙම අලෙවිසැල් හරහා පාරිභෝගිකයින්ට ලබා දෙයි. දිවයින පුරා මෙම අලෙවිසැල් 100 ක් පමණ විවෘත කිරිමට යෝජිත අතර දැනට අලෙවිසැල් 09ක් විවෘත කර ඇත.



අලෙවි සැලක් තුල නිෂ්පාදන ප්‍රදර්ශනය කර ඇති අයුරු

## 11. සෝයා ආශ්‍රිත අගය එකතු කළ ආහාර නිෂ්පාදන ව්‍යාපෘතිය

ප්‍රෝටීන, ලිපිඩ, ඛනිජලවණ හා විටමින් වලින් පරිපූර්ණ ආහාරයක් වන සෝයා බෝංචි ආකලනය කොට පෝෂණ ගුණයෙන් අනූන අධික රුධිර පීඩනය හා දියවැඩියාව ඇතුළු බෝ නොවන රෝග වලින් පෙලෙන බාල මෙන්ම තරුණ, මහළු සැමට ගුණදායක සෝයා ආශ්‍රිත අගය එකතු කළ ආහාර නිෂ්පාදන සමාජය වෙත ඉදිරිපත් කිරීම මෙහි අභිමතාර්ථය වේ. සෝයා වල පවතින අමිහිරි රසය සහ සුවඳ විද්‍යානුකූලව ඉවත්කොට මෙම කෘත්‍යමය ආහාර පාරිභෝගිකයන් වෙත ඉදිරිපත් කරනු ලැබේ. මේ සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් රු.මි. 0.670 ක ප්‍රතිපාදන ලැබීඇත.

මෙමනිෂ්පාදන ඉදිරියේදී රාජ්‍ය හා පෞද්ගලික ව්‍යවසායකත්වය යටතේ වෙළඳ පොළට හඳුන්වා දීමට අපේක්ෂා කෙරේ.





## 12.බඩඉරිඟු ආනයනය කිරීම

පාරිභෝගිකයන්ගේ දැඩි ඉල්ලුම පරිදි ශ්‍රීලංකාවේ කුකුළුමස් සහ බිත්තර නිෂ්පාදනය සඳහා කුකුලන්ගේ ආහාරයේ ප්‍රධාන සංඝටකයක් ලෙසබ ඩඉරිඟු අවශ්‍යවේ. නමුත් පවතින තත්වය තුළ ශ්‍රී ලංකාවේ නිපදවනු ලබන්නේ බඩඉරිඟු මෙ.ටො.200,000 වන අතර එය සත්ත්ව ආහාර නිෂ්පාදනය සඳහා ආනයනික අගයක් වෙයි.එය වාර්ෂික අවශ්‍යතාවයෙන් 50% ක් පමණය.

දැනට බඩඉරිඟු ආනයනය පෞද්ගලික සමාගම් හරහා සිදු කරන අතර ඔවුන් ඒ සඳහා ඒකාධිකාරියක් පවත්වා ගෙන යැම තුළ කුකුළු ආහාර නිෂ්පාදන වල මිල ඉහළ යෑමෙන් පාරිභෝගිකයා දැඩි අසීරුතාවයකට පත් වී ඇත. මෙම තත්වය නියාමනය කිරීම සඳහා ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාගේ මඟපෙන්වීම යටතේ සත්ත්ව ආහාර සඳහා මෙ.ටො.50,000ක් ආනයනය කිරීම සඳහා අවසර ලබා දෙන ලදී. මේ සඳහා පුද්ගලික අංශයේ ව්‍යවසායකත්ව දායකත්වයෙන් යුතුව බඩඉරිඟු ආනයනය කළ අතර එයින් මෙ.ටො.37,000ක් ආනයනය කරන ලද අතර උපයාගත් ආදායම රු.මි.1754.28 සහ ශුද්ධ ලාභය රු.මි.35.08 කි.

## 13.දේශීය සෝයා බෝංචි මිලදී ගැනීමේ ව්‍යාපෘතිය

සෝයා බෝංචි වගා කරන ගොවින් දිරිමත් කිරීම, ඔවුන් සවිබල ගැන්වීම, ඔවුන්ගේ ආර්ථිකය සුරක්ෂිත කිරීම ප්‍රධාන ප්‍රෝටීන ප්‍රභවයක් ලෙස සෝයා බෝංචි වගාව තව දුරටත් ව්‍යාප්ත කිරීම ආදි අභිමතාර්ථ ඉටුකර ගැනීම සඳහා 2016.11.01 දින පැවැති කැබිනට් රැස්වීමේ තීරණය අනුව සෝයා බෝංචි මෙ.ටො. 5000 ක් ගොවීන්ගෙන් මිලට ගෙන ත්‍රිපෝෂ ආයතනය වෙත සැපයීමේ කටයුතු සිදු කරන ලදී.

මෙහිදී උපුල්දේණිය රජයේ ගබඩාව හරහා ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය සෝයා බෝංචි කිලෝ ග්‍රෑම් 1ක් සඳහා රු.95.00ක් ලබාදුන් අතර උපුල්දෙණිය ගබඩාවේදී ඒවා පිරිසිදු කර රු. 110.00 කට ත්‍රිපෝෂ ආයතනනය වෙත සපයන ලදී. එසේම උපුල්දෙණිය ගබඩාව වෙත ප්‍රමාණවත් තරම් සෝයා බෝංචි තොග නොලැබුණු හෙයින් පෞද්ගලික අංශයද මේ සමඟ සහභාගි කොට ව්‍යාපෘතිය සිදු කරන ලදී.මිලදී ගත් මුළු සෝයා බෝංචි ප්‍රමාණය කි.ග්‍රෑ. 786,185.60 ක් වන අතර ඒ සඳහා රු.මි.75.40 ක ආදායමක් උපයා ගන්නා ලදී.

## 14.භාණ්ඩාගාරප්‍රතිපාදන

| | අයවැයප්‍රතිපාදන 2017 (රු.මි.) | ලැබුන ප්‍රධානයන් (රු.මි.) | සත්‍යවියදම (රු.මි.) | වැඩිවියදම (රු.මි) |
|---|---|---|---|---|
| පුනරාවර්තන | 61.702 | 40.000 | 47.601 | 7.601 |
| ප්‍රාග්ධන | 2.800 | 2.800 | 2.830 | 0.030 |
| එකතුව | 64.502 | 42.800 | 50.431 | 7.631 |

## 15.වෙනත්ප්‍රතිපාදන
**(කෘෂිකර්ම අමාත්‍යාංශය, කෘෂිකර්මදෙපාර්තමේන්තුව සහ ලෝක ආහාර වැඩසටහන)**

| | මුදල (රු. මි) |
|---|---|
| පුනරාවර්තන | **4.532** |
| ප්‍රාග්ධන | **0.108** |
| එකතුව | **4.640** |

# 2017 වාර්ෂික ගිණුම් වාර්තාව

## ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය

මෙම මූල්‍ය තත්ත්ව ප්‍රකාශණය සහ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශණය සාමාන්‍ය පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සකස් කර ඇති අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව, ඓතිහාසික පිරිවැය පදනම මත සහ අඛණ්ඩ පැවැත්ම පදනම මත පිහිටා සකස් කර ඇත.

### ගිණුම්කරණ ප්‍රතිපත්ති:

1. ක්ෂය ගණනය කිරීම්, වත්කම් මිලදී ගත් දිනයේ සිට සිදුකරන අතර සියලුම වත්කම් ඵලදායි ජීවිත කාලය පුරා ක්ෂය කර ඇත.
2. ලැබිය යුතු ශේෂ සඳහා බොල් සහ අඩමාන ණය සඳහා වෙන් කිරීම් සිදුකර ඇත.
3. හඳුනාගත් සියලුම වගකීම් සඳහා වෙන් කිරීම් කර ඇත.
4. පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් ගණනය කර ඇත්තේ පාරිතෝෂිත හිමි එක් එක් සේවකයන්ගේ සේවා කාලය පදනම් කර ගනිමිනි.
5. වියදම් ඉක්මවා ගිය ආදායම් ගණනය කර ඇත්තේ දන්නා සියලුම වගකීම් සඳහා වෙන් කිරීම් සිදුකළ පසුවය.
6. තොග ගණනය කරනු ලබන්නේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් වඩා අඩු අගයට වන අතර, පහත සඳහන් තොග සඳහා පිරිවැය පහත සඳහන් ක්‍රම යටතේ ගණනය කර ඇත.
    - අමුද්‍රව්‍ය - ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමය අනුව සත්‍ය පිරිවැයට පෙන්වනු ලබයි.
    - නොනිමි තොග - ඍජු අමුද්‍රව්‍ය පිරිවැයට පෙන්වනු ලබයි.
    - නිමි තොග - ඍජු අමුද්‍රව්‍ය,විචල්‍ය පොදුකාර්ය පිරිවැය සහ ඍජු වැටුප් ඇතුළත්ව සත්‍ය පිරිවැයට පෙන්වනු ලබයි.
    - පාරිභෝගික ද්‍රව්‍ය - සත්‍ය පිරිවැය පෙන්වනු ලබයි.

7. රජයෙන් ලද ප්‍රතිපාදන ආදායම් ප්‍රකාශණයේ ආදායමක් ලෙස වෙන්කර පෙන්වා ඇති අතර වියදම් අයිතමයන්ද වෙන්කර ඉදිරිපත් කර ඇත.

## ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය

1.2017 වර්ෂය තුළ දී ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

| ව්‍යාපෘතිය | අරමුදල් ලබා දුන්නේ | ව්‍යාපෘතිය පිහිටි ස්ථානය |
|---|---|---|
| ගොවිපල සංවර්ධනය - තණමල්විල | ස්ව අරමුදල් | තණමල්විල |
| ගොවිපලසංවර්ධනය- බුත්තල | ස්ව අරමුදල් | බුත්තල |
| පාරම්පරික සහල් ව්‍යාපෘතිය | ස්ව අරමුදල් | කළංකුට්ටිය |
| පැල තවාන - දෙහිවල | ස්ව අරමුදල් | දෙහිවල |
| පැල තවාන - ප්‍රධාන කාර්යාලය | ස්ව අරමුදල් | නාරාහේන්පිට |
| සුළු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | ගොවි සංවර්ධන | හම්බන්තොට |
| සෝයා ආශ්‍රිත අතුරු නිෂ්පාදන ව්‍යාපෘතිය | කෘෂිකර්ම අමාත්‍යාංශය | ගන්නොරුව |
| සහල් බලකරණ ව්‍යාපෘතිය | ලෝක ආහාර වැඩසටහන | කළංකුට්ටිය |
| ඌණ භාවිත පලතුරු වලින් පලතුරු බීම නිෂ්පාදනය | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | ගන්නොරුව |
| හෙල්දි ෆුඩ් අලෙවිසැල් සහ හෙල්දි ෆුඩ් බසාර් | ස්ව අරමුදල් | කොළඹ |
| දේශීය බඩඉරිඟු මිලදී ගැනීමේ ව්‍යාපෘතිය | ස්ව අරමුදල් | ප්‍රධාන කාර්යාලය |
| සහල් පිටි ව්‍යාපෘතිය | ස්ව අරමුදල් | කළංකුට්ටිය |
| සෝයා ව්‍යාපෘතිය | ගොවි භාරකාර අරමුදල | උඩුපල්දෙණිය |
| සුවපෝෂ පෝෂණ පැකැට්ටුව | ස්ව අරමුදල් | ගන්නොරුව |
| මව්පෝෂ පෝෂණ පැකැට්ටුව | ස්ව අරමුදල් | ගන්නොරුව |
| කාබනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීම | ස්ව අරමුදල් | බුත්තල |
| ගොවි නිෂ්පාදන අලෙවි සැල-දෙහිවල | ස්ව අරමුදල් | දෙහිවල |
| හෙල්දි ෆුඩ් භෝජනාගාරය | ස්ව අරමුදල් | නාරාහේන්පිට |

2.ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය යටතේ පහත සඳහන් ජංගම ගිණුම් මෙම වසරේදී පවත්වා ගෙන යන ලදී.

- 194125 - භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රතිපාදන.
  කෘෂිකර්ම අමාත්‍යාංශය, ලෝක ආහාර වැඩසටහන සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ලැබෙන ප්‍රතිපාදන
  බුත්තල ගොවිපල සංවර්ධනය, තණමල්විල ගොවිපල සංවර්ධනය, අම්බලන්තොට ගොවිපල සංවර්ධනය , සුවපෝෂ ව්‍යාපෘතිය, මව්පෝෂ ව්‍යාපෘතිය, වතුකරයේ සහල් පිටි භාවිතය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය, පැල තවාන, දෙහිවල අලෙවිසැල, හෙල්දි ෆුඩ් භෝජනාගාරය, කොම්පොස්ට් ව්‍යාපෘතිය
- 337100196138295 - දෙහිවල අලෙවිසැලේ ආදායම
- 78641885 - හෙල්දි ෆුඩ් බසාර්
- 80681636 - සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කිරිමේ ව්‍යාපෘතිය

3. සෑම ව්‍යාපෘතියක් සඳහාම වෙන වෙනම ලෙජර් පවත්වා ගෙන යනු ලබයි.

## ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය
### 2017 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| විස්තරය | සටහන | 2017 රු. | 2016 රු. |
|---|---|---|---|
| *වත්කම්* | | | |
| *ජංගම නොවන වත්කම්* | | | |
| **දේපල පිරියත සහ යෙදවුම්** | 1 | ***339,966,422.68*** | ***337,395,749.18*** |
| ඉඩම් | | 307,200,000.00 | 307,200,000.00 |
| ගොඩනැගිලි | | 15,505,012.13 | 16,078,696.90 |
| මෝටර් වාහන | | 3,376,116.44 | 3,900,000.00 |
| යන්ත්‍රෝපකරණ හා යන්ත්‍ර සූත්‍ර | | 5,829,684.51 | 1,587,339.79 |
| ලී බඩු සහ සවි කිරීම් | | 1,095,382.81 | 992,168.92 |
| කාර්යාල උපකරණ | | 1,388,060.88 | 1,690,775.58 |
| කෘෂිකාර්මික උපකරණ | | 1,44,000.00 | 281,000.00 |
| උද්‍යාන උපකරණ | | 251,704.03 | 331,302.03 |
| වෙනත් උපකරණ | | 1,346,999.33 | 1,675,256.08 |
| පරිගණක උපාංග | | 1,012,612.21 | 725,195.01 |
| තාවකාලික ගොඩනැගිලි | | 1,903,988.87 | 2,015,988.21 |
| මිනුම් උපකරණ | | 184,761.47 | 69,626.66 |
| **අස්පෘශ්‍ය වත්කම්** | | | |
| මෘදුකාංග | | 728,100.00 | 848,400.00 |
| | | | |
| **මූල්‍ය වත්කම්** | | ***93,969,576.67*** | ***806,118.84*** |
| ඉතුරුම් තැන්පතු | | 196,000.16 | 806,118.84 |
| ස්ථිර තැන්පතු | | 93,553,075.19 | - |
| ආපදා ණය | | 220,501.32 | - |
| | | | |
| *ජංගම වත්කම්* | | ***47,118,804.59*** | ***28,230.216.97*** |
| තැන්පතු | | 111,816.50 | 201,816.50 |
| තොගය | | 15,225,417.73 | 16,262,291.19 |
| ණය ගැතියෝ | | 716,862.77 | 938,993.77 |
| ඉදිරියට කළ වියදම් | | 1,445,668.16 | - |
| ලැබිය යුතු මුදල් | | 16,082,465.12 | 10,606,619.17 |
| අතැති සහ බැංකු මුදල් | | 13,536,574.31 | 220,496.34 |
| | | | |
| **මුළු වත්කම්** | | **481,054,803.94** | **366,432,084.99** |
| | | | |
| *හිමිකම් හා වගකීම්* | | | |
| *ප්‍රාග්ධනය හා සංචිතය* | | ***377,315,712.04*** | ***333,666,727.38*** |
| අරමුදල් ශේෂය | | 377,703,946.72 | 374,870,896.72 |
| ඒකාබද්ධ අරමුදල | | (388,234,68) | (41,204,169.34) |
| | | | |
| *ජංගම නොවන හිමිකම්* | | ***6,898,935.50*** | ***13,775,284.82*** |
| විශ්‍රාම පාරිතෝෂිත වගකීම් | | 5,198,935.50 | 3,875,284.82 |
| මධ්‍ය කාලීන ණය | | 1,700,000.00 | 9,900,000.00 |
| *ජංගම වගකීම්* | | ***96,840,156.40*** | ***18,990,072.79*** |
| රඳවාගත් අරමුදල | | 395,852.40 | 145,701.45 |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | | 83,248,149.90 | 1,073,000.00 |
| උපචිත වියදම් | | 13,196,154.10 | 17,771,371.34 |
| *මුළු හිමිකම් හා වගකීම්* | | **481,054,803.94** | **366,432,084.99** |

## ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය
## 2017 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

| විස්තරය | සටහන් | 2017 රු. | 2016 රු. |
|---|---|---|---|
| *ආදායම්* | | **100,221,233.87** | **73,426,388.30** |
| භාණ්ඩාගාර/අමාත්‍යාංශ ප්‍රතිපාදන | 5,6 | 44,532,882.42 | 61,112,012.18 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 2 | 49,578,684.51 | 11,525,055.49 |
| ඉතිරිකිරීම් ගිණුම් වල පොලිය | | 4,902,736.94 | 31,640.63 |
| වත්කම් ඉවත් කිරීමෙන් ලද මුදල | | - | 2,314,950.00 |
| වත්කම් විකුණුම් මුදල් භාණ්ඩාගාරය වෙත සම්ප්‍රේෂණය කිරීම | | - | (2,508,700.00) |
| වෙනත් ආදායම් | | 1,206,930.00 | 951,430.00 |
| | | | |
| *වියදම්* | | **62,748,852.41** | **75,769,730.36** |
| පුද්ගල වේතන | | 37,404,501.50 | 33,912,586.68 |
| ගමන් වියදම් | | 697,189.09 | 681,562.05 |
| සැපයුම් සහ අවශ්‍යතා | | 2,340,711.10 | 5,339,316.35 |
| ස්ථාවර වත්කම් අලුත්වැඩියාව සහ නඩත්තුව | | 7,602,947.76 | 4,272,608.03 |
| පරිවර්තන, සන්නිවේදන,උපයුක්ත සහ වෙනත් සේවාවන් | | 14,703,502.96 | 31,563,657.25 |
| | | | |
| *වියදම් ඉක්ම වූ ආදායම/ අතිරික්තය (ඌනතාවය)* | | **37,472,381.46** | **(2,343,342.06)** |

**ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය**
**2017 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | සටහන | 2017 රු. | 2016 රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාවන් මඟින් (භාවිතා කරන) /ලැබෙන මුදල් ප්‍රවාහ** | | | |
| ආදායම් බදු වලට පෙර ශුද්ධ ලාභය / අලාභය | | 37,472,381.46 | (2,343,342.06) |
| **ගැලපුම්** | | | |
| ක්ෂය කිරීම් | 1 | 4,800,502.63 | 5,449,799.62 |
| වාහන ඉවත් කිරීම් / මාරු කිරීම් ක්ෂය | | - | (1,006,250.00) |
| දේපල පිරියත සහ උපකරණ ඉවත් කිරීම්/ මාරු කිරීම් | | | 1,200,000.00 |
| ගොවීන්ගේ ණය කපා හැරීම් | | - | 80,610.50 |
| අයෝජන ක්‍රියාකාරකම් මඟින් ඉපැයූ පොලී ආදායම | | 4,902,736.94 | - |
| තැන්පතු | | 90,000.00 | - |
| පෙර කාල පරිච්ඡේදයේ ගැලපුම් | | 3,268,553.20 | 1,642,078.30 |
| විශ්‍රාමික පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් | | | (1,743,191.80) |
| විශ්‍රාමික ප්‍රතිලාභ සඳහා වෙන් කිරීම් | | 1,323,650.68 | 1,342,160.32 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලටපෙර මෙහෙයුම් ලාභය** | | **51,857,824.91** | **4,621,864.88** |
| | | | |
| තොගය (වැඩිවීම්)/ අඩුවීම් | | 1,036.873.46 | (11,388,257.87) |
| පාරිතෝෂිත ගෙවීම් | | | (569,139.50) |
| වෙළඳ සහ වෙනත් ලැබීම් (වැඩිවීම්)/ අඩුවීම් | | (6,699,383.11) | (10,226,335.66) |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දේ වල වැඩි කිරීම් / අඩුකිරීම් | | 77,850,083.61 | 12,865,534.02 |
| මෙහෙයුම් මඟින් ජනනය වූ මුදල් | | 72,187,573.96 | (9,318,199.01) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මඟින් ලද ශුද්ධ මුදල්** | | **124,045,398.87** | **(4,696,334.13)** |
| **ආයෝජන ක්‍රියාකාරකම් මඟින් ලැබුණු (භාවිතා කළ) / මුදල් ප්‍රවාහය** | | | |
| දේපල, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම් | 1 | (7,371,176.13) | (1,033,210.42) |
| දේපල, පිරියත සහ උපකරණ ඉවත් කිරීම්/ මාරු කිරීම් | | - | 2,508,700.00 |
| ආයෝජන ක්‍රියාකාරකම් / (භාවිතා කළ) මගින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | **(4,902,736.94)** | **(31,640.63)** |
| ඉතුරුම් තැන්පතු වැඩිවීම / අඩුවීම | | 610,118.68 | - |
| ස්ථාවර තැන්පතු වැඩිවීම / අඩුවීම | | (397,303,075.19) | - |
| ස්ථාවර තැන්පතු වැඩිවීම / අඩුවීම | | 303,750,000.00 | - |
| වාහන විකුණුම් ආදායම් මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීම | | - | (2,508,700.00) |
| **ආයෝජන ක්‍රියාකාරකම් / (භාවිතා කළ) මගින් ලද ශුද්ධ මුදල්** | | (105,216,869.58) | (1,064,851.05) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් මඟින් ලද / ( භාවිතා කළ මුදල් ප්‍රවාහය** | | | |
| අරමුදල් ලැබීම් | | 47,440,932.42 | 61,112,012,18 |
| ආධාර මුදල් | | (44,532,882.42) | (61,112,012.18) |
| ආපදා ණය ගෙවීම් | | (248,064.00) | |
| ආපදාණය නැවත ගෙවීම් | | 27,562.68 | - |
| ණය ආපසු ගෙවීම් | | (13,200,000.00) | 20,000,000.00 |
| ණය ලැබීම් | | 5,000,000.00 | (15,687,500.06) |
| | | **(5,512,451.32)** | **4,312,499.94** |

| | | | |
|---|---|---|---|
| මුදල් සහ මුදල් වලට සමාන දේ වල ශුද්ධ වැඩිවීම් / (අඩුවීම්) | | 13,316,077.97 | (1,448,685.24) |
| වර්ෂය මුලදී තිබූ මුදල් සහ මුදල් වලට සමාන දේ | | 220,496.34 | 1,669,181.58 |
| වර්ෂය අවසානයේදී තිබූ මුදල් සහ මුදල් වලට සමාන දේ | | **13,536,574.31** | **220,496.34** |
| **සටහන - A** | | | |
| බැංකු ශේෂය | | 220,496.34 | 1,669,181.58 |
| සුළු මුදල් | | - | |
| අත ඉතිරි මුදල් | | - | - |
| | | **220,496.34** | **1,669,181.58** |

**ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය**
**2017 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය**

| | ප්‍රත්‍යාගණන අරමුදල රු. | අරමුදල් ශේෂය රු. | ඒකාබද්ධ අරමුදල රු. | එකතුව රු. |
|---|---|---|---|---|
| 01.01.2017 දිනට ශේෂය | 328,671,316.14 | 46,199,580.58 | (41,204,169.34) | 333,666,727.38 |
| | | | | |
| ලැබුණු අරමුදල් | | 47,440,932.42 | | 47,440,932.42 |
| | | | | |
| ආධාර මුදල් | | (44,532,882.42) | | (44,532,882.42) |
| | | | | |
| පෙර කාලච්ඡේද ගැලපීම් | | (75,000.00) | 3,343,553.20 | 3,268,553.20 |
| | | | | |
| ඌන වෙන් කිරීම් | | - | - | - |
| | | | | |
| ශුද්ධ අතිරික්තය / (ඌනතාවය) | | | 37,472,381.46 | 37,472,381.46 |
| | **328,671,316.14** | **49,032,630.58** | **(388,234.68)** | **377,315,712.04** |

සටහන01

ජංගම නොවන වත්කම්

| වත්කම් වර්ගය | ඉඩම් සහ ගොඩනැගිලි | මෝටර් වාහන | යන්ත්‍රෝපකරණ සහ උපකරණ | කාර්යාලීය උපකරණ | ලී බඩු සහ සවි කිරීම් | කෘෂි උපකරණ | උද්‍යාන උපකරණ | වෙනත් උපකරණ | ඡායාරූප සහ සිනමා උපකරණ | තාවකාලික ගොඩනැගිලි | මැනීම් උපකරණ | පරිගණක උපකරණ | මෘදුකාංග | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2017.01.01 දිනට ශේෂය | 323,278,696.90 | 3,900,000.00 | 1,587,339.79 | 1,690,775.58 | 992,168.92 | 281,000.00 | 331,302.03 | 1,675,256.08 | - | 2,015,988.21 | 69,626.66 | 725,195.01 | 848,400.00 | 337,395,749.18 |
| එකතු කිරීම් | 346,514.90 | 802,500.00 | 4,821,030.00 | 111,550.00 | 384,059.23 | - | - | 127,050.00 | - | - | 148,672.00 | 629,800.00 | - | 7,371,176.13 |
| ඉවත් කිරීම් / මාරු කිරීම්(ස්ථාවර වත්කම්) | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ඉවත් කිරීම්/ මාරු කිරීම්(සමුච්චිත ක්ෂය කර ඇති අගයන්) | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| වර්ෂය සඳහා ක්ෂය වීම් | (920,199.67) | (1,326,383.56) | (578,685.28) | (414,264.70) | (280,845.34) | (137,000.00) | (79,598.00) | (455,306.75) | - | (111,999.34) | (33,537.19) | (342,382.80) | (120,300.00) | (4,800,502.63) |
| ශුද්ධ ප්‍රත්‍යාගණනය | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 2017.12.31 දිනට ශුද්ධ අගය | **322,705,012.13** | **3,376,116.44** | **5,829,684.51** | **1,388,060.88** | **1,095,382.81** | **144,000.00** | **251,704.03** | **1,346,999.33** | **-** | **1,903,988.87** | **184,761.47** | **1,012,612.21** | **728,100.00** | **339,966,422.68** |
| ප්‍රත්‍යාගණන අතිරික්තයේ එකතුව | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ප්‍රත්‍යාගණන ඌණතාවයේ එකතුව | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| දළ ධාරණ වටිනාකම | 325,456,843.31 | 7,302,500.00 | 7,709,810.00 | 2,617,621.78 | 2,067,905.98 | 639,500.00 | 397,990.00 | 2,740,400.00 | 3,540.00 | 2,239,986.89 | 279,412.00 | 2,305,960.00 | 1,089,000.00 | 354,850,469.96 |
| සමුච්චිත ක්ෂය වීම් | (2,751,831.18) | (3,926,383.56) | (1,880,125.49) | (1,229,560.90) | (972,523.17) | (495,500.00) | (146,285.97) | (1,393,400.67) | (3,540.00) | (335,998.02) | (94,650.53) | (1,293,347.79) | (360,900.00) | (14,884,047.28) |
| ශුද්ධ ධාරණ වටිනාකම | **322,705,012.13** | **3,376,116.44** | **5,829,684.51** | **1,388,060.88** | **1,095,382.81** | **144,000.00** | **251,704.03** | **1,346,999.33** | **-** | **1,903,988.87** | **184,761.47** | **1,012,612.21** | **728,100.00** | **339,966,422.68** |

**සටහන02 : වෙළඳ හා ලාභ අලාභගිණුම්**

**2.1** දෙහිවල අලෙවිසැල

**31.12.2017 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම**

| අයිතම | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|
| වෙළඳ ආදායම | 35,142,766.23 | 30,681,101.67 |
| <u>අඩුකලා</u>: විකුණුම් පිරිවැය | | |
| ආරම්භක තොගය | 1,768,921.58 | 1,370,466.62 |
| මිලදී ගැනීම් | 30,448,180.84 | 26,262,266.37 |
| ප්‍රවාහන | - | 64,422.00 |
| අවසාන තොගය | (1,925,528.72) | (1,768,921.58) |
| | 30,291,573.70 | 25,928,233.41 |
| දළ ලාභය/අලාභය | **4,851,192.53** | **4,752,868.26** |
| පොදු කාර්ය පිරිවැය | (6,520,792.54) | (5,227,963.20) |
| ශුද්ධලාභය/අලාභය | **(1,669,600.01)** | **(475,094.94)** |

## 2.2 ආපනශාලාව - දෙහිවල

### 31.12.2017 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

| අයිතම | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|
| වෙළඳ ආදායම | **5,913,736.63** | **4,968,368.00** |
| <u>අඩුකලා</u>: විකුණුම් පිරිවැය | | |
| ආරම්භක තොගය | 39,498.30 | 23,792.60 |
| මිලදී ගැනීම් | 4,998,735.19 | 4,746,710.84 |
| ප්‍රවාහන | - | |
| අවසාන තොගය | (48,541.36) | (39,498.30) |
| | 4,989,692.13 | 4,731,005.14 |
| දළ ලාභය/අලාභය | **924,044.50** | **237,362.86** |
| පොදු කාර්ය පිරිවැය | (725,741.20) | (573,689.76) |
| ශුද්ධලාභය/අලාභය | **198,303.30** | **(336,326.90)** |

## 2.3 ආපනශාලාව - සත්වෝද්‍යාන දෙහිවල

### 31.12.2017 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

| අයිතම | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|
| වෙළඳ ආදායම | **5,620,143.00** | **6,772,486.00** |
| <u>අඩුකලා</u>:විකුණුම් පිරිවැය | | |
| ආරම්භක තොගය | 162,707.76 | 180,635.92 |
| මිලදී ගැනීම් | 4,358,703.34 | 4,555,287.92 |

| | | |
|---|---|---|
| අවසාන තොගය | - | (162,707.76) |
| | 4,521,411.10 | 4,573,216.08 |
| **දළ ලාභය/අලාභය** | **1,098,731.90** | **2,199,269.92** |
| පොදු කාර්ය පිරිවැය | (1,258,076.50) | (1,142,483.74) |
| **ශුද්ධලාභය/අලාභය** | **(159,344.60)** | **1,056,786.18** |

**2.4** පැල අලෙවි සැල - නාරාහේන්පිට

**31.12.2017 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම**

| අයිතම | **2017**<br>රු. | **2016**<br>රු. |
|---|---|---|
| **වෙළඳආදායම** | **10,707,540.40** | **9,504,277.40** |
| අඩුකලා: විකුණුම්පිරිවැය | | |
| ආරම්භකතොගය | 717,087.84 | 1,059,868.78 |
| මිලදී ගැනීම් | 7,577,655.59 | 5,885,065.35 |
| අවසානතොගය | (1,037,884.50) | (717,087.84) |
| | 7,256,858.93 | 6,227,846.29 |
| **දළ ලාභය/අලාභය** | **3,450,681.47** | **3,276,431.11** |
| පොදු කාර්යපිරිවැය | (1,913,891.19) | (1,810,963.94) |
| **ශුද්ධලාභය/අලාභය** | **1,536,790.28** | **1,465,467.17** |

**2.5** පැල අලෙවි සැල - දෙහිවල
**31.12.2017 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම**

| අයිතම | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|
| **වෙළඳ ආදායම (පැළ සහපෙහොර)** | **5,828,989.49** | **4,275,431.00** |
| අඩුකලා: විකුණුම්පිරිවැය | | |
| ආරම්භකතොගය | 956,813.78 | 126,271.80 |
| මිලදී ගැනීම් | 3,830,118.64 | 2,872,271.00 |
| තොග හානි | - | - |
| අවසානතොගය | (634,626.65) | (956,813.78) |
| | 4,152,305.77 | 2,041,729.02 |
| **දළ ලාභය/අලාභය** | **1,676,683.72** | **2,233,701.98** |
| පොදු කාර්යපිරිවැය | (1,063,950.10) | (924,270.40) |
| **ශුද්ධලාභය/අලාභය** | **612,733.62** | **1,309,431.58** |

## 2.6 සහල් පිටි ප්‍රවර්ධනයකිරීමේ ව්‍යාපෘතිය

### 31.12.2017 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

| අයිතම | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|
| ආරම්භක තොගය | 18,525.00 | 442,681.10 |
| මිලදීගැනීම් | 187,875.00 | 1,237,135.00 |
| තොග හානි | - | (18,525.00) |
| අවසාන තොගය -අමුද්‍රව්‍ය | - | - |
| අමුද්‍රව්‍යපිරිවැය | 206,400.00 | 1,661,291.10 |
| ආරම්භක තොගය-නොනිමිවැඩ | 124,440.00 | - |
| තොග හානි | - | (124,440.00) |
| අවසාන තොගය-නොනිමිවැඩ | - | - |
| නිෂ්පාදනපිරිවැය | 330,840.00 | 1,536,851.10 |
| **විකුණුම්ආදායම** | **364,770.00** | **1,412,650.32** |
| අඩුකලා: විකුණුම්පිරිවැය | | |
| ආරම්භකතොගය | 70,229.80 | 33,724.50 |
| නිෂ්පාදනවියදම | 330,840.00 | 1,536,851.10 |
| | 401,069.80 | 1,570,575.60 |
| තොගහානි | - | (42,900.00) |
| අවසානතොගය | (71,167.84) | (27,329.80) |
| | 329,901.96 | 1,500,345.80 |
| දළ ලාභය/අලාභය | **34,868.04** | **(87,695.48)** |
| පොදු කාර්ය පිරිවැය | (455,380.20) | (2,138,698.64) |
| ශුද්ධලාභය/අලාභය | **(420,512.16)** | **(2,226,394.12)** |

**2.7** **සුවපෝෂ**

**31.12.2017 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභගිණුම**

| අයිතම | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|
| ආරම්භකතොගය | 130,000.00 | 140,000.00 |
| මිලදී ගැනීම | 97,225.00 | 337,756.00 |
| තොග හානි | - | (130,000.00) |
| අවසාන තොගය-අමු ද්‍රව්‍ය | (90,250.00) | - |
| අමුද්‍රව්‍යපිරිවැය | 136,975.00 | 347,756.00 |
| ආරම්භකතොගය-නොනිමි වැඩ | - | - |
| අවසානතොගය-නොනිමි වැඩ | - | - |
| නිෂ්පාදනවියදම | 136,975.00 | 347,756.00 |
| **විකුණුම්ආදායම** | **190,610.00** | **261,036.60** |
| අඩුකලා: විකුණුම් පිරිවැය | | |
| ආරම්භක තොගය | 233.25 | 10,000.00 |
| නිෂ්පාදනවියදම | 136,975.00 | 347,756.00 |
| | 137,208.25 | 357,756.00 |
| අවසාන තොගය | (31,535.40) | (233.25) |
| | 105,672.85 | 357,522.75 |
| **දළ ලාභය/ අලාභය** | **84,937.15** | **(96,486.15)** |
| පොදු කාර්ය පිරිවැය | (440,335.70) | (642,622.40) |
| **ශුද්ධ ලාභය/අලාභය** | **(355,398.55)** | **(739,108.55)** |

**2.8** හෙල්දි ෆුඩ් ආපනශාලාව

**31.12.2017 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභගිණුම**

| අයිතම | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|
| වෙළඳආදායම | **2,447,941.11** | **11,015,509.64** |
| අඩුකලා:විකුණුම් පිරිවැය | | |
| ආරම්භක තොගය | 44,718.50 | 237,898.50 |
| මිලදී ගැනීම් | 2,106,560.95 | 9,298,610.39 |
| වැටුප් | 968,608.28 | 4,367,587.34 |
| අවසාන තොගය | - | (44,718.50) |
| | 3,119,887.73 | 13,859,377.73 |
| දළ ලාභය/අලාභය | **(671,946.62)** | **(2,843,868.09)** |
| පොදු කාර්ය පිරිවැය | (222,162.79) | (968,647.85) |
| ශුද්ධලාභය/අලාභය | **(894,109.41)** | **(3,812,515.94)** |

**2.9** මව්පෝෂ

**31.12.2017 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභගිණුම**

| අයිතම | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|
| ආරම්භක තොගය | 271,555.00 | 482,774.50 |
| මිලදී ගැනීම් | 1,832,714.50 | 396,250.00 |
| සෘජු වැටුප් | - | - |
| ප්‍රවාහන | - | 26,300.00 |
| තොග හානි | - | (265,000.00) |
| අවසාන තොගය- අමු ද්‍රව්‍ය | (842,150.00) | (6,555.00) |
| | 1,262,119.50 | 633,769.50 |
| ආරම්භක තොගය-නොනිමි වැඩ | - | - |
| අවසාන තොගය-නොනිමි වැඩ | - | - |
| නිෂ්පාදන පිරිවැය | 1,262,119.50 | 633,769.50 |
| වෙළඳආදායම | **922,260.00** | **773,995.35** |

| | | |
|---|---|---|
| අඩුකලා: විකුණුම් පිරිවැය | | |
| ආරම්භකතොගය | 68,394.08 | 295,460.00 |
| නිෂ්පාදනවියදම | 1,262,119.50 | 633,769.50 |
| | 1,330,513.58 | 929,229.50 |
| තොගහානි | - | (67,797.62) |
| අවසාන තොගය | (56,266.06) | (596.46) |
| | 1,274,247.52 | 860,835.42 |
| **දළ ලාභය/ අලාභය** | **(351,987.52)** | **(86,840.07)** |
| පොදු කාර්යපිරිවැය | (1,039,062.89) | (1,570,957.20) |
| **ශුද්ධලාභය/අලාභය** | **(1,391,050.41)** | **(1,657,797.27)** |

**2.10** **කොම්පොස්ට් ව්‍යාපෘතිය -බුත්තල**

**31.12.2017 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභගිණුම**

| අයිතම | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|
| ආරම්භක තොගය | 234,349.80 | - |
| මිලදී ගැනීම | 1,536,260.68 | 946,553.60 |
| සෘජු වැටුප් | - | - |
| ප්‍රවාහන | - | - |
| අවසාන තොගය- අමු ද්‍රව්‍ය | (356,342.20) | (234,349.80) |
| | 1,414,268.28 | 712,203.80 |
| ආරම්භක තොගය-නොනිමිවැඩ | - | - |
| අවසාන තොගය-නොනිමි වැඩ | - | - |
| නිෂ්පාදන වියදම | 1,414,268.28 | 712,203.80 |
| **වෙළඳ ආදායම** | **1,612,750.00** | **916,206.25** |
| අඩුකලා: විකුණුම් පිරිවැය | | |
| ආරම්භකතොගය | - | - |
| නිෂ්පාදනවියදම | 1,414,268.28 | 712,203.80 |

| | | |
|---|---|---|
| අවසාන තොගය | - | - |
| | **1,414,268.28** | **712,203.80** |
| **දළ ලාභය/ අලාභය** | **198,481.72** | **204,002.45** |
| පොදු කාර්යපිරිවැය | (256,247.00) | (147,408.90) |
| **ශුද්ධලාභය/අලාභය** | **(57,765.28)** | **56,593.55** |

**2.11** **පාරම්පරික සහල්ව්‍යාපෘතිය**

**31.12.2017 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම**

| අයිතම | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|
| ආරම්භකතොගය | 854,895.00 | 313,509.00 |
| මිලදී ගැනීම් | 424,843.55 | 5,559,276.40 |
| ප්‍රවාහන | - | 33,915.00 |
| ඇඹරුම් පිරිවැය | - | 124,380.00 |
| සෘජු වැටුප් | - | 659,448.00 |
| තොග හානි | - | (732,375.00) |
| අවසාන තොගය | - | (122,520.00) |
| | 1,279,738.55 | 5,835,633.40 |
| ආරම්භක තොගය-නොනිමි වැඩ | 1,013,841.00 | - |
| තොග හානි | - | (1,013,841.00) |
| අවසාන තොගය-නොනිමි වැඩ | - | - |
| නිෂ්පාදන වියදම | 2,293,579.55 | 4,821,792.40 |
| **වෙළඳ ආදායම** | **1,936,915.00** | **4,467,445.00** |
| අඩුකලා:විකුණුම් පිරිවැය | | |
| ආරම්භක තොගය | 1,097,800.00 | 156,950.00 |
| නිෂ්පාදනවියදම | 2,293,579.55 | 4,821,792.40 |
| | 3,391,379.55 | 4,978,742.40 |
| තොග හානි | - | (1,029,860.00) |
| අවසාන තොගය | - | (67,940.00) |
| | 3,391,379.55 | 3,880,942.40 |

| | | |
|---|---|---|
| **දළ ලාභය/අලාභය** | **(1,454,464.55)** | **586,502.60** |
| පොදු කාර්යපිරිවැය | (1,531,660.91) | (167,822.40) |
| **ශුද්ධලාභය/අලාභය** | **(2,986,125.46)** | **418,680.20** |

**2.12** **බුත්තල ගොවිපල**

**31.12.2017 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභගිණුම**

| අයිතම | 2017 රු. | 2016 රු. |
|---|---|---|
| ආරම්භක තොගය | - | - |
| මිලදී ගැනීම් | | 3,575.00 |
| අවසාන තොගය- අමු ද්‍රව්‍ය | - | - |
| | - | 3,575.00 |
| ආරම්භක තොගය-නොනිමි වැඩ | - | - |
| අවසාන තොගය-නොනිමි වැඩ | - | - |
| නිෂ්පාදන වියදම | - | 3,575.00 |
| **වෙළඳ ආදායම** | **9,201.00** | **4,000.00** |
| <u>අඩුකලා</u>:විකුණුම් පිරිවැය | | |
| ආරම්භක තොගය | - | - |
| නිෂ්පාදනවියදම | - | 3,575.00 |
| අවසාන තොගය | - | - |
| | **-** | **3,575.00** |
| **දළ ලාභය/අලාභය** | **9,201.00** | **425.00** |
| පොදු කාර්යපිරිවැය | 525,407.80 | 542,637.75 |
| **ශුද්ධලාභය/අලාභය** | **(516,206.80)** | **(542,212.75)** |

**2.13**

**තණමල්විල ගොවිපල**

**31.12.2017 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභගිණුම**

| අයිතම | **2017** රු. | **2016** රු. |
|---|---|---|
| **ගොවිපල ආදායම** | **155,000.00** | **128,000.00** |
| අඩුකලා: විකුණුම් පිරිවැය | | |
| ආරම්භක තොග | | |
| නිෂ්පාදනවියදම | - | - |
| අවසාන තොග | - | - |
| | **-** | **-** |
| **දළ ලාභය/අලාභය** | **155,000.00** | **128,000.00** |
| පොදු කාර්යපිරිවැය | (483,239.76) | (655,412.52) |
| **ශුද්ධලාභය/අලාභය** | **(328,239.76)** | **(527,412.52)** |

**2.14**

**සෝයා ව්‍යාපෘතිය**

**31.12.2017 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභගිණුම**

| අයිතම | **2017** රු. | **2016** රු. |
|---|---|---|
| **වෙළඳ ආදායම** | **75,404,780.00** | **-** |
| අඩුකලා: විකුණුම්පිරිවැය | | |
| ආරම්භකතොග | 8,631,729.50 | - |
| මිලදීගැනීම් | 72,656,438.72 | 8,574,519.50 |
| ඇසුරුම්කිරීම | 116,301.00 | 72,756.68 |
| තොගසැකසුම් ගාස්තු | 439,757.50 | 90,258.10 |
| ධූමකරණවියදම | 109,983.75 | 55,140.00 |
| තොග හානි | - | - |

| | | |
|---|---|---|
| අවසානතොග | (10,130,705.00) | (8,631,729.50) |
| | **71,823,505.47** | **160,944.78** |
| දළ ලාභය/අලාභය | **3,581,274.53** | **(160,944.78)** |
| පොදු කාර්ය පිරිවැය | (1,284,839.70) | **-** |
| ශුද්ධලාභය/අලාභය | **2,296,434.83** | **-** |

**2.15** **දේශීය බඩඉරිඟු මිලදී ගැනීමේ ව්‍යාපෘතිය**
**31.12.2017 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභගිණුම**

| අයිතම | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|
| වෙළඳ ආදායම | **13,860.00** | **16,137,660.00** |
| <u>අඩුකලා</u>: විකුණුම් පිරිවැය | | |
| ආරම්භක තොග | 56,551.00 | |
| මිලදී ගැනීම් | - | 15,189,871.25 |
| ප්‍රවාහන | - | 115,000.00 |
| ඇසුරුම් කිරීම | - | 132,812.50 |
| තොග හානි | - | (56,551.00) |
| අවසාන තොග | - | |
| | **56,551.00** | **15,381,132.75** |
| දළ ලාභය/අලාභය | **(42,691.00)** | **756,527.25** |
| පොදු කාර්ය පිරිවැය | **-** | (638,345.69) |
| ශුද්ධලාභය/අලාභය | **(42,691.00)** | **118,181.56** |

**2.16** **BFN ව්‍යාපෘතිය**

**31.12.2017 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභගිණුම**

| අයිතම | 2017<br>රු. |
|---|---|
| **වෙළඳ ආදායම** | **106,500.00** |
| අඩුකලා:විකුණුම් පිරිවැය | |
| ආරම්භක තොග | - |
| මිලදී ගැනීම් | 54,480.00 |
| ප්‍රවාහන | - |
| තොග හානි | - |
| අවසාන තොග | (420.00) |
| | **54,060.00** |
| **දළ ලාභය/අලාභය** | **52,440.00** |
| පොදු කාර්ය පිරිවැය | 180,272.55 |
| **ශුද්ධලාභය/අලාභය** | **(127,832.55)** |

**2.17**

බඩඉරිඟු (ආනයනය)ව්‍යාපෘතිය

**31.12.2017 න්අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභඅලාභ ගිණුම**

| අයිතම | 2017<br>රු. |
|---|---|
| වෙළඳ ආදායම | **1,754,284,010.64** |
| <u>අඩුකලා</u>: විකුණුම් පිරිවැය | |
| ආරම්භක තොග | - |
| මිලදී ගැනීම් | 1,718,240,745.73 |
| ප්‍රවාහන | - |
| ඇසුරුම් කිරීම | 61,027.27 |
| තොග හානි | - |
| අවසාන තොග | - |
| | **1,718,301,773.00** |
| දළ ලාභය/අලාභය | **35,982,237.64** |
| පොදු කාර්ය පිරිවැය | 895,090.74 |
| ශුද්ධලාභය/අලාභය | **35,087,146.90** |

**සටහන 02 - වෙළඳ ලාභ/ අලාභ ගිණුම් (සාරාංශය)**

| ව්‍යාපෘතිය | 2017 | | 2016 | |
|---|---|---|---|---|
| | දළ ලාභය/ (අලාභය) | ශුද්ධ ලාභය/(අලාභය) | දළ ලාභය/ (අලාභය) | ශුද්ධ ලාභය/ (අලාභය) |
| | රු. | රු. | රු. | රු. |
| දෙහිවල අලෙවිසැල | 4,851,192.53 | (1,669,600.01) | 4,752,868.26 | (475,094.94) |
| ආපනශාලාව - දෙහිවල | 924,044.50 | 198,303.30 | 237,362.86 | (336,326.90) |
| ආපනශාලාව -සත්වෝද්‍යානය දෙහිවල | 1,098,731.90 | (159,344.60) | 2,199,269.92 | 1,056,786.18 |
| පැල අලෙවි සැල - නාරාහේන්පිට | 3,450,681.47 | 1,536,790.28 | 3,276,431.11 | 1,465,467.17 |
| පැල අලෙවි සැල -දෙහිවල | 1,676,683.72 | 612,733.62 | 2,233,701.98 | 1,309,431.58 |
| සහල් පිටි ව්‍යාපෘතිය -කලංකුට්ටිය | 34,868.04 | (420,512.16) | (87,695.48) | (2,226,394.12) |
| සුවපෝෂ ව්‍යාපෘතිය | 84,937.15 | (355,398.55) | (96,486.15) | (739,108.55) |
| හෙල්දිව් ෆුඩ් ආපනශාලාව -නාරාහේන්පිට | (671,946.62) | (894,109.41) | (2,843,868.09 ) | (3,812,515.94) |
| මව්පෝෂ ව්‍යාපෘතිය | (351,987.52) | (1,391,050.41) | (86,840.07) | (1,657,797.27) |
| බුත්තල කොම්පෝස්ට් | 198,481.72 | (57,765.28) | 204,002.45 | 56,593.55 |
| පාරම්පරික සහල් ව්‍යාපෘතිය | (1,454,464.55) | (2,986,125.46) | 586,502.60 | 418,680.20 |
| බුත්තල ගොවිපල | 9,201.00 | (516,206.80) | 425.00 | (542,212.75) |
| තණමල්විල ගොවිපල | 155,000.00 | (328,239.76) | 128,000.00 | (527,412.52) |
| සෝයා ව්‍යාපෘතිය | 3,581,274.53 | 2,296,434.83 | (160,944.78) | - |
| දේශීය බඩඉරිඟු මිලදී ගැනීමේ ව්‍යාපෘතිය | (42,691.00) | (42,691.00) | 756,527.25 | 118,181.56 |
| BFN ව්‍යාපෘතිය | 52,440.00 | (127,832.55) | - | - |
| බඩඉරිඟු (ආනයන) ව්‍යාපෘතිය | 35,982,237.64 | 35,087,146.90 | - | - |
| මුං ඇට ව්‍යාපෘතිය | - | - | 275,675.00 | |
| හෙල්දිව් ෆුඩ් බසාර් | - | - | 150,123.63 | - |
| එකතුව | **49,578,684.51** | **30,782,532.94** | **11,525,055.49** | **(5,891,722.75)** |

**03** සෘජු සංවර්ධන වියදම් ආධාර මුදල් යටතේ දක්වා ඇත.

**04** ප්‍රධාන කාර්යාලයේ පරිපාලනය සඳහා දැරූ සියලු වියදම් භාණ්ඩාගාර අරමුදල් යටතේ දරා ඇත.

**05** භාණ්ඩාගාර අරමුදල්

| විස්තරය | අයවැය ප්‍රතිපාදන | 2017 සත්‍ය වියදම් | 2017 වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන | ඉතිරිය / ඌනතාවය |
|---|---|---|---|---|
| පුනරාවර්ථන | 61,702,155.00 | 47,601,770.36 | 40,000,000.00 | 21,702,155.00 |
| ප්‍රාග්ධන | 2,800,000.00 | 2,830,250.00 | 2,800,000.00 | - |
| | | | **42,800,000.00** | |

# 2017 විගණන වාර්තාව

C-14

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ජීජීඑල්/ඩී/එචසීබී/01/17/17
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2018 ජූලි 19 දින

FFHC BOARD
30 JUL 2018
1042
No. 45, Kirimandala Mw., Narahenpita.

සභාපති,
ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය.

**ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

යථෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

පිටපත් - 1. ලේකම් - කෘෂිකර්ම අමාත්‍යාංශය
2. ලේකම් - මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඒජීඑල්/ඩී/එච්සීබී/01/17/17 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2018 ජූලි 19 දින

සභාපති,
ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය.

**ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1973 අංක 15 දරන ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩල පනතේ 14 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2018 මැයි 31 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
Auditor General's Department
AGDSL

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ආනයනය කර තිබූ බඩ ඉරිඟු කිලෝග්‍රෑම් 237,937 ක් වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට පුද්ගලික ආයතනයකට රු. 11,773,265 ක් ගෙවිය යුතු වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු. 11,163,064 ක් ලෙස දැක්වීම හේතුවෙන් ජංගම වගකීම් රු.610,201 කින් අඩුවෙන් සහ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට ඇසුරුම් ද්‍රව්‍ය භෞතික තොග වටිනාකම රු.192,404 ක් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඇසුරුම් ද්‍රව්‍ය තොගය සහ අතිරික්තය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

3

(ඇ) හාල් කෙටීමේ සහ එසවීමේ යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානයේදී අත්තිකාරම් ලෙස ගෙවා තිබූ රු. 4,821,030 ක මුදල අත්තිකාරම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට වත්කම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට වත්කම්වල පිරිවැය එකී ප්‍රමාණයෙන් සහ ක්ෂය රු.2,642 කින් වැඩියෙන් දක්වා තිබුණි.

**2.2.2 පැහැදිලි නොකල වෙනස්කම්**

2017 දෙසැම්බර් 31 දිනට ලෙජර් ගිණුම් අනුව සෝයා බෝංචි අවසන් තොගය රු.9,442,810 ක් හා භෞතික තොග සත්‍යාපන වාර්තා අනුව එය රු. 10,130,705 ක් වූයෙන් රු. 687,895 ක පැහැදිලි නොකල වෙනසක් විය.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 හා 2012 වර්ෂවල සිට පැවත එන එකතුව රු. 691,211 ක් වූ ණයගැති ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මණ්ඩලය විසින් ගොවිහාර අරමුදලින් 2011 හා 2012 වර්ෂවල ලබාගෙන තිබූ රු.2,500,000 ක් වූ ණය මුදල 2013 වර්ෂය තුළ ගෙවා අවසන් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසානයට තවදුරටත් පොලිය රු.401,315 ක් ඇතුළුව එකතුව රු.2,101,315 ක ණය ශේෂයක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වර්ෂ 2 ට වැඩි කාලයක සිට පැවත එන රු. 410,293 ක ණයහිමි ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

4

විගණකාධිපති දෙපාර්තමේන්තුව
Auditor General's Department

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | (i) කාර්යය නිම කළ විගසම තත්කාර්ය අතුරු අග්‍රිම පියවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී අවස්ථා 46 කදී ලබා දී තිබූ රු.676,400 ක් වූ අග්‍රිම දින 32 සිට දින 210 ක කාල ප්‍රමාදයකින් පසුව පියවා තිබුණි. එසේම, රජයේ මුදල් අත රඳවා ගෙන ප්‍රමාද වී පියවීම් සිදු කරනු ලබන නිලධාරීන්ට දිගින් දිගටම තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දී තිබූ අතර, ලබාගත් අතුරු අග්‍රිම පියවීමට පෙර තවත් අග්‍රිමයක් ලබා ගත් අවස්ථා 117 ක් නිරීක්ෂණය විය. |
| | (ii) අවස්ථා 09 කදී නිලධාරීන් 05 දෙනෙකු විසින් තත්කාර්ය අතුරු අග්‍රිම ලෙස රු.164,000 ක් ලබා ගෙන කාර්යය ඉටු කිරීමකින් තොරව දින 72 සිට දින 168 දක්වා වූ කාල පරාසයක් මුදල් අත රඳවා ගෙන ආපසු පියවා තිබුණි. |
| (ආ) 2017 දෙසැම්බර් 21 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 02/2017 ප්‍රකාරව | ලියාපදිංචි අයිතිය නොමැතිව පරිහරණය කරන වාහන ලියාපදිංචි අයිතිය ඇති ආයතනයේ එකඟතාවය මත මණ්ඩලයේ නමින් විධිමත්ව ලියාපදිංචි කර ගැනීමට කටයුතු කල යුතුය. එහෙත් මණ්ඩලය විසින් කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් වාහන 03 ක් |

5

විගණකාධිපති දෙපාර්තමේන්තුව
Auditor General's Department

හා මහවැලි අධිකාරියට, සුළු අපනයන බෝග ප්‍රවර්ධන මණ්ඩලයට හා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයට අයත් වාහන 03 ක් එසේ මණ්ඩලය නමින් ලියාපදිංචි කර ගැනීමකින් තොරව භාවිතා කරමින් පැවතුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.37,472,381 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 2,343,342 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 39,815,723 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී ප්‍රවාහන, සන්නිවේදන, උපයෝගිතා සහ වෙනත් සේවා වියදම රු. 16,860,155 කින් අඩුවීම සහ ආනයනය කරන ලද බඩ ඉරිඟු ව්‍යාපෘතිය මගින් රු. 35,087,146 ක ආදායමක් ලබා තිබීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේදී රු.5,077,456 ක ඌනතාවයක් ලබා තිබුණ ද, 2014 වර්ෂයේදී රු. 1,921,514 ක අතිරික්තයක් ඇති වි තිබුණි. එසේ 2015 හා 2016 වර්ෂවල නැවතත් ඌනතාවයක් ඇති වී තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේදී නැවතත් රු. 37,472,381 ක අතිරික්තයක් ඇති වී තිබුණු අතර එහි වර්ධනය සියයට 1950 ක් විය. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු. 17,172,617 ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානයට රු. 79,677,384 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව ජංගම අනුපාතය එකකින් අඩු වී තිබූ අතර, ගෙවිය යුතු තැන්පතු රු.82,175,150 කින් වැඩිවීම ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

6

**3.3 මණ්ඩලයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

2012 වර්ෂයේදී මණ්ඩලයට නීත්‍යානුකුල අයිතියක් නොමැති ඉඩමක වැටක් ඉදිකිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව හා ප්‍රසම්පාදන පටිපාටියෙන් බැහැරව ලබා දී තිබූ කොන්ත්‍රාත්තුවක් සඳහා කොන්ත්‍රාත්කරු වෙත මුදල් නොගෙවීම හේතුවෙන් රු. 3,209,728 ක වන්දි මුදලක් ඉල්ලා මණ්ඩලයට එරෙහිව බාහිර පාර්ශවයක් විසින් නඩු පවරා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුව රු.මිලියන 3713.24 ක් වැය කර ව්‍යාපෘති 14 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තු කර තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) තණමල්විල ගොවිපළ සහ බුත්තල ගොවි පොළ**

පිළිවෙලින් අක්කර 16 කින් සහ අක්කර 10 කින් තණමල්විල සහ බුත්තල ගොවිපළ සතු භූමිය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඵලදායී ලෙස වගා කටයුතු සඳහා උපයෝජනය කර නොතිබුණි.

**(ආ) පලතුරු පරිභෝජනය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය (BFN)**

දේශීය ඌනතා වන පලතුරුවලට අගය එකතු කොට පාරිභෝගිකයා හට ලබාදීමට හා දේශීය පලතුරු පරිභෝජනය ඉහළ නැංවීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය මගින් සමාලෝචිත වර්ෂය තුල බීම බෝතල් 3,600 ක් නිෂ්පාදනයට සැලසුම් කර තිබුණු නමුත්, බෝතල් 1,420 ක් පමණක් නිෂ්පාදනය කර තිබුණි.

(ඇ) **මව්පෝෂ ව්‍යාපෘතිය හා සාම්ප්‍රදායික සහල් ව්‍යාපෘතිය**

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව, මව්පෝෂ පැකට් 4000 ක් සහ සහල් පිටි පැකට් 48000 ක් නිෂ්පාදනය කිරීමට සැලසුම් කර තිබුණද පිළිවෙලින් පැකට් 1685 ක් හා පැකට් 1316 ක් පමණක් නිෂ්පාදනය කර තිබුණි. ඉල්ලුම හඳුනාගෙන විධිමත් පරිදි සැලසුම් කිරීමට කටයුතු කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මව්පෝෂ ව්‍යාපෘතිය සඳහා මිලදීගෙන තිබූ රු.842,150 ක් වටිනා අමුද්‍රව්‍ය තොග සහ සහල් ව්‍යාපෘතිය සඳහා මිලදීගෙන තිබූ රු.192,404 ක් වටිනා ඇසුරුම් ද්‍රව්‍ය තොග ඉතිරි වී තිබුණි.

(ඈ) **හෙළ බොජුන් හල**

2017 නොවැම්බර් 17 දින හෙළ බොජුන් හල ආරම්භ කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ආරම්භ කර නොතිබුණි.

(ඉ) **කුඩා වැව් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය**

වියළි කලාපයේ වැව් ගැඹුරු කර පිළිසකර කිරීමේ ව්‍යාපෘතියට අදාළ ව්‍යාපෘති වාර්තාව සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණු අතර, ක්‍රියාකාරී සැලැස්මට අනුව, සමාලෝචිත වර්ෂයේදී වැව් 36 ක සංවර්ධනය අපේක්ෂා කළද වැව් 27 ක් පමණක් ගැඹුරු කර තිබුණි.

(ඊ) ක්‍රියාකාරී සැලැස්මට අනුව, වස විස නැති ආහාර රට පුරා ව්‍යාප්ත කිරීමේ අරමුණින් වීදි ආහාර භාවිතය විධිමත් කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 72.10 ක් වෙන් කර තිබූ අතර, මූලික පියවර ලෙස අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි වීදි ආහාර නිෂ්පාදන කරත්ත 100 ක් ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළදී එම කාර්යය ඉටුකර නොතිබුණි.

**4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ ලියාපදිංචි වී සිටින සුළු ව්‍යාපාරිකයින්ගේ නිෂ්පාදන අලෙවි කිරීමේ කටයුතු සඳහා හෙල්දිී හුඩ් අලෙවි පොළක් 2016 වර්ෂය තුළදී ආරම්භ කර තිබුණු අතර, ඒ අනුව නිෂ්පාදන අලෙවි කිරීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමකින් තොරව බාහිර පාර්ශවයක් තෝරා ගෙන ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුමෙහි V වගන්තිය ප්‍රකාරව එක් වරකදී අලෙවි කිරීමට ලබාදිය හැකි නිෂ්පාදනවල උපරිම වටිනාකම රු.ලක්ෂ 05 ක් පමණක් වුවද, එම සීමාව ඉක්මවා රු.1,966,824 ක නිෂ්පාදන ලබාදී තිබුණි. තවද, VI වගන්තිය ප්‍රකාරව විකුණුම්වලට අදාළ මුදල් දින 15 ක් තුල ලැබිය යුතු වුවත් අදාළ මුදල් ලැබී නොතිබියදී දිගින් දිගටම මණ්ඩලය විසින් එම පාර්ශවය වෙත නිෂ්පාදන ලබාදීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු. 590,919 ක් අයවිය යුතුව තිබූ අතර, VI වගන්තිය ප්‍රකාරව අයකර ගත යුතු අධිභාර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂය තුලදී රු. 375,905 ක් වටිනා ආහාර නිෂ්පාදන ආපසු භාරදීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් මණ්ඩලයට අලාභයක් සිදු වී තිබුණි.

(ආ) වස විසවලින් තොර පාරම්පරික දේශීය ආහාර පාරිභෝජන රටාවක් ඇති කිරීමේ අරමුණින් 2012 වර්ෂයේ ආරම්භ කරන ලද හෙල්දිී හුඩ් භෝජනාගාරයෙන් 2012 වර්ෂයේදී රු. 406,765 ක අලාභයක් ඇති වී තිබූ නමුත් 2015 වර්ෂය අවසාන වන විට රු.4,192,533 ක් දක්වා අලාභය වැඩි වී තිබුණි. ඉන්පසු අලාභය ක්‍රමයෙන් අඩු වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී එය රු. 894,109 ක් වී තිබුණි. 2017 මාර්තු මාසයේ සිට අලාභය අඩු කර ගැනීම සඳහා ඉලක්කගත වැඩපිළිවෙළක් සකස් කරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සභාපති වෙත දන්වා තිබියදීත් ඊට පටහැනිව හිටපු සභාපති සහ උප සභාපති විසින් භෝජනාගාරය වසා දැමීමට කටයුතු කර තිබුණි.

**4.3 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

--------------------------------------------

දෙහිවල අලෙවි සැලෙහි බේකරියක් පවත්වා ගෙනයාම සඳහා 2012 වර්ෂයේදී මිලදීගෙන තිබූ රු.452,000 ක් වටිනා උපකරණ භාවිතයට නොගෙන ගබඩාවේ නිෂ්ක්‍රියව පැවතුණි.

9

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනුමත කාර්ය මණ්ඩලය 28 ක් වුවද, 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව සේවකයින් 37 ක් බඳවා ගැනීම් හේතුවෙන් සත්‍ය කාර්ය මණ්ඩලය 65 ක් වී තිබූ අතර, එම කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඉහත චක්‍රලේඛයේ 7 වන ඡේදය ප්‍රකාරව, 2014 නොවැම්බර් 12 දිනෙන් පසුව තාවකාලික, අනියම්, ආදේශන සහ කොන්ත්‍රාත් පදනම මත සේවකයින් බඳවා ගත යුත්තේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියෙන් පසුව වුවද, ඊට පටහැනිව කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 3 දෙනෙකු බඳවා ගෙන සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා ලෙස රු. 798,566 ක් ගෙවා තිබුණි.

**5. තිරසර සංවර්ධනය**

**තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර, සමාලෝචිත වර්ෂයට අදාළව මණ්ඩලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගැනීම සිදුකර තිබුණි.

**6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**6.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

**6.1.1 ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන සැලැස්මෙහි හෝ ප්‍රාග්ධන වැය ඇස්තමේන්තුවේ ඇතුළත්ව නොතිබූ රු. 802,500 ක මෝටර් සයිකල් 03 ක් හා රු. 148,672 ක ගෝලීය පිවිසුම් පද්ධති (Global Processing System) උපකරණ 02 ක් මිලදී ගෙන තිබුණි.

(ආ) මණ්ඩලය විසින් රු. 4,821,030 ක වියදමින් සහල් කෙටීමේ යන්ත්‍රයක් හා එසවුම් උපකරණ සහ විදුලි සවි කිරීම් මිලදී ගැනීම සඳහා රු. 50,000 ක් වැයකර පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය මගින් ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර තිබුණි. ඒ අනුව, එම වාර්තාව මගින් සැපයුම්කරුවන් 8 දෙනෙකු යෝජනා කර තිබූ නමුත්, සැපයුම්කරුවන් 3 දෙනෙකුගෙන් පමණක් හා ඊට පරිබාහිර සැපයුම්කරුවන් 05 දෙනෙකුගෙන් ලංසු කැඳවීම් සිදුකර තිබුණි. තවද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ප්‍රකාරව වෙළඳ පොළ මිල සැදහුම් ක්‍රමය මගින් ලංසු කැඳවීමට දින 07 ක කාලයක් ලබා දිය යුතු වුවත්, මණ්ඩලය විසින් දින 05 ක කාලයක් පමණක් ලබා දී තිබූ අතර 8.9.1 වගන්තිය ප්‍රකාරව තෝරාගත් සැපයුම්කරු සමග ගිවිසුමකට එළඹීම සහ 5.4.10 වගන්තිය ප්‍රකාරව කාර්ය සාධන සුරක්ෂණයක් ලබා ගැනීම සිදුකර නොතිබුණි.

(ඇ) සත්ත්ව ආහාර නිෂ්පාදනය කරනු ලබන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට අත්‍යවශ්‍ය බඩ ඉරිඟු ඉතා ඉහල මිලකින් අලෙවි කිරීම පාලනය කිරීමේ අරමුණින් හා වෙළඳපොලෙහි ඇති බඩ ඉරිඟු හිඟතාවය මත මණ්ඩලය මගින් බඩ ඉරිඟු ආනයනය කර ලබාදීමට කටයුතු කර තිබුණි. ඒ අනුව, 2017 වර්ෂය සඳහා බඩ ඉරිඟු මෙට්‍රික් ටොන් 50000 ක් ආනයනය කිරීමට මණ්ඩලය කටයුතු කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 (අ) ඡේදය ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස්කර නොතිබුණි.

(ii) 2006 ප්‍රසම්පාදන අත්පොතේ 2.8.2 වගන්තිය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා අවම වශයෙන් සාමාජිකයින් 5 දෙනෙකු පත්කල යුතු වුවත් ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් තුන්දෙනකු පමණක් පත්කර තිබුණි.

(iii) තෝරාගත් ලංසුකරුගේ මිල අනුව, ආනයනය කිරීමට ලංසු කැඳවා තිබූ බඩ ඉරිඟු තොගයේ වටිනාකම රු.මිලියන 2474 ක්වූ බැවින් 2006 රජයේ ප්‍රසම්පාදන සංග්‍රහයේ අතිරේඛ 28 හි 2.14.1 වගන්තිය ප්‍රකාරව සැපයුම්කරු තෝරා ගැනීම සඳහා ජාතික තරඟකාරී ලංසු කැඳවීම මගින් ලංසු කැඳවීම ප්‍රසිද්ධ කලයුතු වුවත් ඊට අනුකූල නොවන ලෙස ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවා තිබුණි. තවද, මිලියන 200 ට වැඩි සැපයුම් සඳහා අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවක්

11

විසින් තීරණ ගැනීම සිදුකල යුතු වුවත් ඊට පටහැනිව ඉහත සැපයුම දෙපාර්තමේන්තු සුළු ප්‍රසම්පාදන කමිටුවක් මගින් සිදුකර තිබුණි.

(iv) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 වගන්තිය ප්‍රකාරව හා සැපයුම්කරුවන් වෙත නිකුත් කර තිබුණු ලංසු ලියවිලිවල ඇතුලත් කොන්දේසි අංක 10 ප්‍රකාරව ඉදිරිපත් කලයුතු කාර්ය සාධන සුරක්ෂණය ඉදිරිපත් කර නොතිබූ අතර සැපයුම්කරුවන්ගේ මූල්‍ය ශක්‍යතාවය තහවුරු කරගත් බවට සාක්ෂිද ඉදිරිපත් නොවීය.

(v) මිල ගණන් විවෘත කිරීම, මිල ගණන් විවෘත කිරීමේ කමිටුව මගින් 2017 ජනවාරි 24 දින සිදුකර තිබු නමුත් ඊට පෙර මණ්ඩලයේ සභාපතිවරයාගේ 2016 නොවැම්බර් 25 දිනැති ලිපිය මගින් මෙට්‍රික් ටොන් 50000 ක්, කිලෝග්‍රෑමයක් රු.44 බැගින් ආනයනය කිරීමට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබූ සැපයුම්කරු වෙත ලිඛිතව දන්වා තිබුණි. තවද, ඉහත ඇණවුමෙන් පසුව මිල වෙනස් කිරීම සඳහා කිසිදු හේතු දැක්වීමකින් තොරව නැවතත් 2017 ජනවාරි 09 දිනැති PD/16/M-Import ලිපිය මගින් මෙට්‍රික් ටොන් 25000 ක් කිලෝග්‍රෑමයක් 49.485 බැගින් ඇණවුම් කර තිබුණි. ඒ අනුව, මිල ගණන් කැඳවීමට පෙර ඇණවුම් භාරදීම හේතුවෙන් ඉහත ප්‍රසම්පාදන ක්‍රියාවලිය විනිවිදභාවයකින් තොරව සිදුකර ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(vi) සැපයුම්කරු සමග එළඹ තිබූ දින රහිත ගිවිසුම ප්‍රකාරව 2017 මාර්තු 31 දින වනවිට මුළු තොගයෙන් මෙට්‍රික් ටොන් 25000 ක් ආනයනය කලයුතු බව සැපයුම්කරු වෙත දන්වා තිබුණද 2017 මැයි 31 දින වනවිටත් සියයට 10 ක් හෙවත් මෙට්‍රික් ටොන් 2500 ක් පමණක් ආනයනය කර තිබීම හේතුවෙන් අදාල ව්‍යාපාරිකයින් වෙත තොග නිකුත් කිරීමට නොහැකි වී තිබූ අතර ඒ අනුව තොග ආනයනය කිරීමේ අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් විගණනයේදී සැක සහිත විය.

(vii) බඩ ඉරිඟු තොගවල තිබිය යුතු ප්‍රමිතිය පිළිබඳව ලංසු කැඳවීම් ලේඛණවල දක්වා තිබූ නමුත් තොග ලැබීමෙන් පසුව මණ්ඩලය මගින් එම තොග තත්ත්ව පරීක්ෂාවට භාජනය කර ව්‍යාපාරිකයින් වෙත නිකුත් කිරීමට කටයුතු කර

12

නොතිබූ අතර සෘජුවම සැපයුම්කරු විසින් තොග ව්‍යාපාරිකයින් වෙත නිකුත් කර තිබුණි. ලංසු ලේඛණ අනුව පිරිවිතරයේ සඳහන් තොගවල තිබිය යුතු උපරිම ඇෆලටොක්සීන් ප්‍රමාණය 20 PPB විය යුතු වුවත් විගණනයේදී සිදුකල නියැදි පරීක්ෂාවට අනුව එම ප්‍රමාණය 58 PPB සිට 310PPB දක්වා වූ අවස්ථා 4 ක් නිරීක්ෂණය විය.

**6.2 අයවැය ලේඛනමය පාලනය**

----------------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත සහ තත්‍ය ආදායම් සහ වියදම්, සැසඳීමේදී සියයට 26 සිට 489 දක්වා විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**6.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

----------------------------------

2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 6.5.3 වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ 2015 සහ 2016 වර්ෂවල වාර්ෂික වාර්තා 2018 අප්‍රේල් 10 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**6.4 නොවිසඳී ඇති විගණන ඡේද**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ පසුගිය විගණන වාර්තාවෙන් පෙන්වා දී තිබුණද, මෙම වාර්තාවේ දින වනවිටත් නිවැරදි කිරීම සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.

(අ) මණ්ඩලයේ පනත සඳහා සංශෝධන ඉදිරිපත් කරන ලෙස 2012 ඔක්තෝබර් 01 දින පැවැත්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව නියෝගයක් ලබා දී තිබූ අතර එම නියෝගය මෙතෙක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේදී නාරාහේන්පිට අලෙවිසැලේ සිදුවී තිබූ රු.77,352 ක සහ 2016 වර්ෂයේදී හෙල්දිඹුඩ භෝජනාගාරයේ සිදු ව තිබූ රු.73,415 ක සහ දෙහිවල අලෙවිසැලේ සිදුවී ඇති මුදල් අක්‍රමිකතා සම්බන්ධයෙන් මෙම වාර්තාවේ දින වනවිටත් අදාල මූලික විමර්ශන සහ විධිමත් විනය පරීක්ෂණ සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.

13

AGDSL
විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | මූල්‍ය පරිපාලනය | අයවැය ලේඛන පාලනය මගින් ආදායම් වියදම් කළමනාකරණය නොකිරීම. |
| (ආ) | වත්කම් පරිපාලනය | වාහන විධිමත් ලෙස පවරා ගෙන නොතිබීම. |
| (ඇ) | කාර්ය මණ්ඩල පරිපාලනය | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූල නොවන ලෙස බඳවා ගැනීම. |
| (ඇ) | ව්‍යාපෘති කළමණාකරණය | සැලසුම් කල ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම ව්‍යාපෘති කාර්යක්ෂම හා ආර්ථිකබවකින් යුක්තව පවත්වාගෙන නොයෑම. |
| (ඉ) | ලිපිගොනු පාලනය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ දැක්වෙන විධිවිධානවලට අනුව ප්‍රසම්පාදන ලිපිගොනු පවත්වාගෙන නොයෑම. |

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)

14